SANRAKSHA

# සංරක්ෂා

ත්‍රෛමාසික පුවත් සංග්‍රහය

ශ්‍රී ලංකා
සුනිත්‍ය බලශක්ති අධිකාරිය

2023 ජනවාරි - මාර්තු - 16 වන කාණ්ඩය - ප්‍රථම කලාපය - ISSSN 2021 9521

# බලශක්ති දරිද්‍රතාවයෙන් අත්මිදෙමු










පිටුදැකීමට නම්...




ඔබ රතු කට්ට ළඟටම ඇවිත් ද?

SANRAKSHA
# සංරක්ෂා

ත්‍රෛමාසික පුවත් සංග්‍රහය

## ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රකාශනයකි


**උපදේශකත්වය**

**රංජිත් සේපාල**
සභාපති

**අතුල ජයතුංග**
අධ්‍යක්ෂ ජනරාල්

**හර්ෂ වික්‍රමසිංහ**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ)

**විමල් නදීර**
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
(ඉල්ලුම් පාර්ශවීය කළමනාකරණ)

**පී.පී.කේ. විජේතුංග**
අධ්‍යක්ෂ (ප්‍රචාරණ හා ප්‍රවර්ධන)

**අනුරුද්ධ එදිරිවීර**
සහකාර අධ්‍යක්ෂ (මාධ්‍ය)

**සංස්කරණය**
චමින්ද ලියනගේ

**සහාය සංස්කරණය**
එස්.එම්. නිමල්කා සමරකෝන්

**පරිගණක අක්ෂර සංයෝගය**
මල්ෂි අධිකාරි

**පිටු සැකසුම**
දිනේෂ් ඉන්දික (indi Creations)
0712667444



**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය**
இலங்கை நிலைபெறுதகு வலு அதிகார சபை
Sri Lanka Sustainable Energy Authority

අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත, කොළඹ 07.
දුරකථනය : 011 257 5030
ෆැක්ස් : 011257 5089


## පෙළගැස්ම


| | |
|---|---|
| ලෝකය පෙළන බලශක්ති දරිද්‍රතාව | 3 |
| බලශක්ති දරිද්‍රතාව පිටුදැකීමට නම්... | 8 |
| ඔබ රතු කට්ට ළඟටම ඇවිත් ද? | 15 |
| බලශක්ති දරිද්‍රතාව පහසුවෙන් පිටුදැකිය හැකි වන්නෙ ගෘහණියටයි ! | 17 |
| ලෝක බැංකු ආධාරයෙන් 1000 MW අක් වෙරළ සුළං බලශක්ති ව්‍යාපෘතිය | 19 |
| සණස සමග ගමට | 20 |


SANRAKSHA සංරක්ෂා

# කතුවැකිය

## බලශක්ති දරිද්‍රතාවයෙන් අත්මිදෙමු!

ආර්ථිකය ගැන කතා කරන විට දරිද්‍රතාවය යන්න නිතර ඇසෙන සුපුරුදු වචනයක් වූවත් බලශක්ති දරිද්‍රතාවය යන්න ඔබ ඇතැම් විට අසන පළමු දිනය අද විය හැකිය. බලශක්ති දරිද්‍රතාවය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලයෙකුගේ හෝ කුටුම්භයක සමස්ත මාසික ආදායමෙන් 10% ක් ඉක්මවා බලශක්ති සඳහා වියදම් වීමයි.

ඒ අනුව ඔබ දැනටමත් බලශක්ති දරිද්‍රතාවයට පත් වී ඇත්ද නැතිනම් බලශක්ති දරිද්‍රතාවයට පත්වීමේ අවදානමට ලක්ව ඇත්දැයි සොයා බැලීම වැදගත් වේ. ඒ අන් කිසිවක් නිසා නොව ඔබ බලශක්ති දරිද්‍රතාවයට පත් වුවහොත් ඔබේ අනෙකුත් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා වන මූල්‍ය හැකියාව නැත්නම් ක්‍රයශක්තිය හීන වී යන බැවිනි.

පුද්ගලයෙක් හෝ කුටුම්බයක් බලශක්ති දරිද්‍රතාවයට පත්වීමේ අවස්ථා දෙකක් පවතී. එනම් කුටුම්බයේ ආදායම අඩුවීම සහ බලශක්ති වියදම ඉහළ යාමයි. මින් බලශක්ති වියදම ඉහළ යාම දෙයාකාරයකට සිදු විය හැකිය. එනම් කුටුම්බයේ බලශක්ති පරිභෝජනය ඉහළ යාම හෝ බලශක්තීන් හි මිල ඉහළ යාමයි. මෑත ඉතිහාසය තුළ මෙරට විශේෂයෙන් මධ්‍යම පන්තිකයන් හා අඩු ආදායම් ලාභීන් සීඝ්‍රයෙන් බලශක්ති දරිද්‍රතාවයට පත් වී ඇති බව සංඛ්‍යා ලේඛන අනුව පෙනීයයි. එයට ප්‍රධාන හේතුව වූයේ රට තුළ ඇති වී ඇති ආර්ථික අර්බුදය හමුවේ බලශක්තීන් හි මිල අධික ලෙස ඉහළ යාමයි. එමෙන්ම දහස් ගණන් ජනතාවගේ ආදායම් මාර්ග අහිමි වීමත් මෙම බලශක්ති දරිද්‍රතාවයට හේතු විය. එසේ නම් ඔබට කුටුම්බයක් ලෙස දරිද්‍රතාවයට පත් වීමෙන් වැළකීමටත්, දරිද්‍රතාවයට පත් වී ඇත්නම් ඉන් මිදීමටත් ගත හැකි ක්‍රියාමාර්ග ද දෙකක් ඇත. එනම් සමස්ත කුටුම්බයේ ආදායම වැඩිකර ගැනීමට ක්‍රියා කිරීම හා ඉහළ යන බලශක්ති වියදම් හමුවේ බලශක්ති පරිභෝජනය කාර්යක්ෂම කිරීම තුළින් බලශක්ති වියදම් අවම කර ගැනීමට උත්සාහ දැරීමයි.

ඔබ බලශක්ති දරිද්‍රතාවයට පත්ව ඇත්නම් ඉන් මිදීමට ක්ෂණිකම හා පහසුම ක්‍රියාමාර්ගය බලශක්ති පරිභෝජනය කාර්යක්ෂම කර ගැනීමයි. ඒ සඳහා ඔබ භාවිත කරන විදුලි උපකරණ ඇත්නම් ඒවා කාර්යක්ෂම උපකරණ දැයි හඳුනාගන්න. එමෙන්ම එම උපකරණ කාර්යක්ෂමව භාවිත කිරීම පිළිබඳව දැනුවත් වෙන්න. එමෙන්ම මුළුතැන්ගෙයි කටයුතු සඳහා ද LP ගෑස් හෝ විදුලිය වෙනුවට ආහාර පිසීමට දර වැනි විකල්ප බලශක්ති ප්‍රභව වලට යොමු විය හැකිනම් එසේ කරන්න. එසේ කිරීමෙන් ඔබට මුළුතැන්ගෙය තුළ මාසිකව වැය වන බලශක්ති වියදම 50% කින් පමණ අඩු කර ගත හැකි වනු ඇත. අනෙක් අතට ප්‍රවාහන කටයුතු වලදී දිනපතා ප්‍රවාහන අවශ්‍යතා කළමනාකරණය කිරීම පුරුදු වන්න. ඒ තුළින් ඔබට මෙන්ම රටටත් බලශක්ති දරිද්‍රතාවයෙන් මිදීමට මඟ පෑදෙනු ඇත.



# ලෝකය පෙළන බලශක්ති දරිද්‍රතාව

**බලශක්ති දරිද්‍රතාවය (Energy Poverty) පිළිබඳව මාතෘකාව සාකච්ඡාවට බඳුන්වන්නේ ඉතා අඩුවෙනි. එසේ වුවත් බලශක්තිය සඳහා ඇති ඉල්ලුම වැඩිවීම, බලශක්ති සැපයුම අඩුවීම, බලශක්ති මිල ඉහළ යෑම යනාදී කාරණා නිසා අපි බොහෝවිට පීඩා විඳින්නෙමු. එබැවින් බලශක්ති දරිද්‍රතාවය පිළිබඳව කතා කිරීමට සුදුසුම අවස්ථාවකට අප දැන් එළඹ සිටින බව රහසක් නොවේ.**

ලෝක ආර්ථික සමුළුව 2010 වසරේදී බලශක්ති දරිද්‍රතාව සම්බන්ධයෙන් නිර්වචනයක් ඉදිරිපත් කළේය. එම නිර්වචනයට අනුව බලශක්ති දරිද්‍රතාවය යනු තිරසාරව, නවීන බලශක්ති සේවාවන් සහ නිෂ්පාදනයන් වෙත ප්‍රවේශවීමට නොහැකිවීමය. මේ නිර්වචනය වඩාත් පුළුල් ලෙස විග්‍රහකර බැලීම වැදගත්වේ. සංවර්ධන කාර්යයට සහාය වන, ප්‍රමාණවත් තරමින් යුක්ත වන, දැරිය හැකි මිලකට ලබාගත හැකි, විශ්වාසදායක, ගුණාත්මක බවෙන් ඉහළ, ආරක්ෂිත, පාරිසරික වශයෙන් අර්බුදකාරී තත්ත්වයන් මතු නොකරන බලශක්ති භාවිතයක් අප සතුව පැවැතිය යුතුව ඇත. එසේ නොවන සෑම අවස්ථාවකදීම බලශක්ති දරිද්‍රතාව විවිධ මානයන්ගෙන් මතුවීම නොවැළැක්විය හැකිය.

බලශක්ති දරිද්‍රතාවය ලොව සෑම රටකම පාහේ දක්නට පුළුවන. එසේ වුවත් එය බහුලවම දැකිය හැකිවන්නේ සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍යවලය. සංවර්ධිත රටවල වුවද බලශක්ති දරිද්‍රතාවයෙන් පීඩාවට පත් ජනයා සිටිති. ”සැමට සුනිත්‍ය බලශක්ති සඳහා වූ අන්තර් ජාතික වර්ෂය” යනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය 2012 වසර නම් කළේද බලශක්ති දරිද්‍රතාවයෙන් පීඩා විඳින ජනයා ඉන් මුදාගැනීමේ අරමුණ ඇතිවය.

බලශක්ති භාවිතය, මානව ශිෂ්ටාචාරයේ ඇන්ජිම වශයෙන් සලකන්නට පුළුවන. එසේ වුවත් ලොව සෑම කලාපයකටම එක හා සමානව බලශක්ති ප්‍රභව බෙදී ගොස් ඇති බවක් දැකිය නොහැකිය. ලොව ඇතැම් රටවලට ඛනිජ තෙල් සම්පත තිබේ. එසේ වුවත් ලොව බොහෝ රටවල ඛනිජ තෙල් සම්පත දක්නට නොලැබෙයි. අයිස්ලන්තය වැනි තවත් සමහර රටවල් භූ තාපය භාවිතයෙන් විදුලි බලය උත්පාදනය කරයි. භූ තාපයෙන් විදුලි බලය උත්පාදනය කිරීමට අනෙක් බොහෝ රටවලට හැකියාවක් නොමැත. අඩු ආදායම් මට්ටමක් සහිත රටවල ජනයාට සිදුවන්නේ තම රටෙහි ඇති බලශක්ති ප්‍රභවවලට සාපේක්ෂව, බලශක්ති අවශ්‍යතා සම්පූර්ණ කර ගැනීමටය. එවැනි රටවලට, තම රටේ ඇති බලශක්ති ප්‍රභවවලින් ප්‍රශස්ත මට්ටමෙන් බලශක්තිය ජනනය කර ගැනීමද ඇතැම් අවස්ථාවල

බොහෝ දුෂ්කරය. බලශක්ති ජනනයට ප්‍රාග්ධනය හිඟකම, තාක්ෂණය නොමැතිවීම, දැනුම නොමැතිවීම වැනි කාරණා ඊට බලපායි. මේ අනුව, අඩු ආදායම් මට්ටමක් සහිත රටවල ජනයාට තම බලශක්ති අවශ්‍යතා සෑමවිටම වාගේ සපුරා ගන්නට සිදුව තිබෙන්නේ දහසකුත් එකක් බාධක මධ්‍යයේය. අඩු ආදායම් මට්ටමේ පසුවන රටවල විදේශ විනිමය බලශක්තිය මිලදී ගැනීමේ කාර්යය වෙනුවෙන් ඇදී යයි. ලෝක වෙළෙඳපොළේ ඛනිජතෙල් මිල ඉහළ යෑම වැනි ගැටලුවලට අඩු ආදායම් ලාභී රටවලට මුහුණ දෙන්නට සිදුවේ. සමහර අවස්ථාවන් වලදී ඛනිජතෙල් හිඟය, ගෑස් හිඟය වැනි ගැටලුවලට ඒ රටවල ජනයා මැදිවෙති. මේ අන්දමට බොහෝ අපහසුතා මධ්‍යයේ බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීම අවසානයේදී මන්දපෝෂණය වැඩිවීම, සෞඛ්‍යසම්පන්න නොවන ජීවන රටාවකට ජනයා තල්ලුවීම, අධ්‍යාපනය ආශ්‍රිත ගැටලු මතුවීම, විරැකියාව වැඩිවීම වැනි තත්ත්වවලට මඟ පාදන බව ඔබ සමහරවිට විශ්වාස නොකරනු ඇත. ජනයාට ජීවිතයෙන් වන්දි ගෙවීමට පවා සිදුවන තරමට එකී ගැටලු බරපතළ වනබව ද අප අමතක නොකළ යුතුය. බලශක්ති දරිද්‍රතාව යම් රටක අර්බුදකාරී සමාජ සහ ආර්ථික ගැටලු ඇති කිරීමට ඉවහල් වනබව මෙයින් පැහැදිලි වේ.

මධ්‍යම යුරෝපයේ සහ නැගෙනහිර යුරෝපයේ බොහෝ ප්‍රදේශවලත්, බටහිර බෝල්කන් ප්‍රදේශවලත්, බෝල්ටික් රටවලත් බලශක්ති දරිද්‍රතාවය ඉතාමත් භයානක මට්ටමක පවතින බව බලශක්ති විශේෂඥයෝ පෙන්වාදෙති. එවැනි තත්ත්වයක් ඇතිවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබෙන්නේ බලශක්ති මිල ඉහළයෑම, ගොඩනැගිලිවල පවත්නා දුර්වල බලශක්ති කාර්යක්ෂමතාව, අකාර්යක්ෂම තාපන පද්ධති, පැරණි ගෘහ උපකරණ භාවිතය බැව් පර්යේෂණවලින් අනාවරණය වී ඇත. දරිද්‍රතාවයෙන් පෙළෙන බොහෝ ප්‍රජාවන්වල ජනයා බලශක්ති දරිද්‍රතාවයේ චක්‍රයක සිරවී සිටින බව විද්වත්හු පෙන්වා දෙති.

දුගී දුප්පත් භාවය නිසා පීඩාවට පත්ව සිටින ජනයාට බලශක්ති නාස්තිය සිදුවන පැරණි නිවාස වලින් ඉවත් වීමට හෝ බලශක්ති කාර්යක්ෂමතාවය උපරිම වන අන්දමට එම නිවාස ප්‍රතිසංස්කරණයකර ගැනීමට හෝ ආර්ථිකමය ශක්තියක් නොමැත. නිදසුනක් ලෙස ශීත කාලයට සරිලන ලෙස නිවාස ඉදිකර නැත්නම් ශීත කාලයේදී බලශක්තිය වැඩියෙන් යොදවමින් නිවස උණුසුම්කර ගන්නට සිදුවේ. ඊට අවශ්‍ය බලශක්තිය සඳහා විශාල වියදමක් දැරිය යුතු වේ. එයින් සිදුවන්නේ ආහාර, ඖෂධ වැනි අත්‍යවශ්‍යම දෙයට මුදල් අඩුවෙන් වියදම්කර එම මුදල් බලශක්ති පරිභරණයට අදාළ බිල්පත් ගෙවීම සඳහා යෙදවීම ය.

මෙවැනි තත්ත්වයන් සැලකිල්ලට ගෙන ලොව ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන බලශක්ති දරිද්‍රතාව මඟහරවා ගැනීම සඳහා විවිධ වැඩසටහන් ජනතාවට හඳුන්වාදී තිබේ. "හීට් ඕර් ඊට්" (Heat or Eat) එවැනි වැඩසටහනකි. "හැබිටෑට් ෆොර් හියුමැනිටි" (Habitat for Humanity) නම් රාජ්‍ය නොවන සංවිධානය බලශක්ති කාර්යක්ෂමතාව අඩු නිවාස අලුත්වැඩියාකර ගැනීම සඳහා උපදෙස් සහ ණය ආධාර ලබාදීම ආරම්භ කර ඇත. එසේම නව නිවාස තනන අයට බලශක්ති කාර්යක්ෂමතාවයෙන් යුත්නව නිවසක් ඉදි කර ගැනීමට අවශ්‍ය උපදෙස් ලබාදීම ද එම ආයතනය මඟින් සිදු කෙරේ. "හැබිටෑට් ෆොර් හියුමැනිටි" ආයතනයේ වැඩපිළිවෙල නැගෙනහිර යුරෝපා සහ මධ්‍යම යුරෝපා රාජ්‍යවල මේ වනවිට ක්‍රියාත්මකවේ. දරිද්‍රතාවයෙන් පෙළෙන ජනයාට උපරිම බලශක්ති කාර්යක්ෂමතාවයක් සහිත නිවාස පවත්වා ගෙන යෑමට එමඟින් සහාය ලැබෙයි. මෙවැනි තවත් වැඩපිළිවෙළ කිහිපයක් බල්ගේරියාව, ක්‍රොඒෂියාව, ග්‍රීසිය, හංගේරියාව, ලිතුවේනියාව, රුමේනියාව, ස්පාඤ්ඤය සහ යුක්‍රේනය වැනි රටවල අද වනවිට ක්‍රියාත්මක වෙමින් තිබේ.

## බලශක්ති දරිද්‍රතාවයක් ඇතිවීමට බලපා ඇති හේතු

බලශක්තිය ලෝක ජනගහනය අතරේ බෙදීයාම සිදුවන්නේ විෂම ආකාරයෙනි. එම විෂම බෙදීයාමද බලශක්ති දරිද්‍රතාවය ඇතිවීම සඳහා විශාල වශයෙන් හේතුවී ඇති බව විද්‍යාඥයන්ගේ මතයයි. පර්යේෂණවලින් අනාවරණය වී ඇති තතු අනුව ලෝක ජනගහනයෙන් බිලියන 3.5කට ආසන්න ප්‍රමාණයක් භුක්ති විඳින්නේ ඔවුන්ගේ ගෘහස්ථ බලශක්ති ඉල්ලුමෙන් 10%කට වඩා අඩු ප්‍රමාණයකි. අනෙක් අතට, ලෝක ජනගහනයෙන් බිලියන 1කට ආසන්න පිරිසක් යුරෝපා ප්‍රමිතීන්ට අනුව ප්‍රකාශිත බලශක්ති මට්ටම හෝ ඊට වැඩියෙන් හෝ භුක්ති විඳිති. වෙනත් ආකාරයකින් දක්වන්නේ නම්, ලෝක ජනගහනයෙන් බිලියන 1කට ආසන්න පිරිසක් ගෝලීය බලශක්ති පරිභෝජනයෙන් අඩකට වගකිව යුතු බව ඉන් ඇඟවේ.

අන්තර් ජාතික බලශක්ති ඒජන්සිය 2018 වසරේ දී කියා සිටියේ එවක ලෝක ජනගහනයෙන් බිලියන 1ක් - නොඑසේනම් ලෝක ජනගහනයෙන් 13%කට ආසන්න ප්‍රමාණයක් විදුලිබල පහසුකම භුක්ති නොවිඳින බවකි. එසේ විදුලිබල පහසුකම භුක්ති නොවිඳින ජනගහනයෙන් වැඩි පිරිසක් වාසය කරන්නේ අප්‍රිකා මහද්වීපයේ සහ දකුණු ආසියාතික කලාපයේ බව ද එම ඒජන්සිය පෙන්වා දෙයි. සහරා කාන්තාරය ආශ්‍රිත රටවල මිලියන 600කට ආසන්න පිරිසකට විදුලිබල පහසුකම තවමත් නොමැතිබව සමීක්ෂණවලින් සනාතව ඇත. විදුලිබල පහසුකම නොලබන ජනයා




බහුලව වෙසෙන අප්‍රිකා රාජ්‍ය අතර ඉතියෝපියාව, කෙන්යාව, සෙනෙගාලය, රුවන්ඩාව සහ ඝානාව යන රාජ්‍ය කැපී පෙනෙයි. විදුලිබල පහසුකම නොමැති මුළු පිරිසෙන් 57%කට ආසන්න ප්‍රමාණයක් සහරා කාන්තාරය ආශ්‍රිතව වෙසෙන බවද විද්වත්හු පෙන්වාදෙති. විදුලිබල පහසුකම නොමැති ආසියාතිකයන් පිරිස මිලියන 350ක් පමණ වේ. විදුලිබල පහසුකම නොමැතිව සිටින සමස්ත ජනගහනයෙන් 9%ක පිරිසක් ආසියාතිකයන් බව ඒ අනුව පැහැදිලි වේ. එකී විෂමතාව දැකිය හැකි වන්නේ විදුලිබල පහසුකම පිළිබඳව පමණක් සලකා බැලූවිටදීය. එමගින්, එම ජන කොටස්වල ඇති කෙරෙන දරිද්‍රතාව ඒ ඒ රටවලත්, අවසාන වශයෙන් ඔවුන් අයත්වන කලාපවලත් සංවර්ධනය පහළ මට්ටමකට හෙළන්නට හේතුවක් වී තිබේ. විදුලිබල පහසුකම භුක්ති නොවිඳින ජනතාවට වසර 2030 වනවිට විදුලි බලය ලබාදීමේ ඉලක්කය එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධනය පිළිබඳ වැඩපිළිවෙළේ එක් අංගයක් වී තිබෙන්නේද එ නිසයි.

විදුලි බල භාවිතය සම්බන්ධයෙන් එක්දහස් නවසිය අනූ ගණන් වලට සාපේක්ෂව විශාල දියුණුවක් 2018 වසර වනවිට දකිනට හැකි වූ බව විද්වත්හු පෙන්වා දෙති. නැගෙනහිර ආසියාව, ලතින් ඇමෙරිකාව යන කලාපවල, එක්දහස් නවසිය අනූව දශකයේදී විදුලිබල භාවිතය බෙහෙවින් ම පහළ මට්ටමක පැවැතියේය. එසේ වුවත් විදුලිබල පහසුකම බෙදීයාමේ විෂමතාව සෑහෙන ප්‍රමාණයකට ඉවත්කිරීමට විවිධ පියවර ගත් නිසා එම කලාපවල ඇතැම් රටවල් අද මේ වනවිට බලශක්ති දරිද්‍රතාවයෙන් බොහෝ දුරට මිදී තිබේ. ඉන්දුනීසියා ජනගහනයෙන් 95%ක් අද වන විට විදුලිබල පහසුකම අත්විඳියි. බංග්ලාදේශයේ ජනගහනයෙන් 80%කටත්, කෙන්යාවේ ජනගහනයේ 73%කටත්, ඉතියෝපියාවේ ජනගහනයෙන් 45% කටත් විදුලිබල පහසුකම අත්විඳින්නට හැකියාව ලැබී තිබීම මඟින් ඒ බැව් තහවුරු වේ.

බොරතෙල් මිල ඉහළ යෑම ද බලශක්ති දරිද්‍රතාවයට හේතුවකි. බොරතෙල් මිල දහනව වන සියවසේදී සහ විසිවන සියවසේ මුල භාගයේදී ස්ථාවරව පැවැතිණ. මේ තත්ත්වය එක්දහස් නවසිය හැත්තෑ ගණන්වලදී වෙනස් වන්නට පටන් ගත්තේය. එවක පටන් තෙල් මිල ගෝලීය වශයෙන් වැඩි වන්නට පටන් ගත්තේ ය. තෙල් මිල උච්චාවචනය වීම හුදෙක් ඉල්ලුම සැපයුම වැනි කාරණා මත පමණක් නොව ආර්ථික, දේශපාලන කාරණා මතත්, යුධ මතත් රඳා පවතින බව අතීත අත්දැකීම් දෙස බැලූවිට පෙනීයයි. යොම් කිපූර් යුධයේදී (Yom Kippur War) ඊශ්‍රායලයට සහාය දැක්වූ පාර්ශවයන් ඉලක්ක කරගනිමින් 1973 වසරේදී ඔපෙක් සංවිධානය තෙල් වෙළෙඳාමට සම්බාධක පැනවීමට පියවර ගැනීම, ඉරාන විප්ලවය, ඉරාන - ඉරාක යුද්ධය, ගල්ෆ් යුද්ධය, එක්දහස් නවසිය අනූ ගණන්වල ඇතිවූ ආසියාතික ආර්ථික අර්බුදය, 2007 - 2008 කාල පරාසයේදී ඇතිවූ ආර්ථික අර්බුදය, ලිබියාවේ සහ

ඊජිප්තුවේ ඇතිවූ කැරලි, රුසියා - යුක්‍රේන යුද්ධය තෙල් මිල උච්චාවචනය වීම සඳහා තදින්ම බලපෑවේය. බොර තෙල් මිල ඉහළයෑම වඩාත් තදින්ම බලපාන්නේ තෙල් සම්පත නොමැති, අඩු ආදායම් මට්ටමේ පසුවන රටවල ජනයාටය. එකී රටවලට බොරතෙල් මිලදී ගැනීමට ඉහළ මිලක් ගෙවන්නට සිදු වේ. එවැනි රටවල් පවත්වාගෙන යන තෙල් දහනය කිරීමෙන් ක්‍රියාත්මක විදුලිබලාගාර පවත්වාගෙන යෑම එවිට දුෂ්කර තත්වයකට පත්වේ. විදුලිය ඒකකයක මිල ඉහළ යෑමෙන් සාමාන්‍ය ජනයාගේ ජනජීවිතය මුළුමනින්ම පාහේ අඩාළවේ. වාහන සඳහා අවශ්‍ය ඉන්ධන සෑම වර්ගයකම මිල ඉහළ යයි. එවිට එම රටවල ප්‍රවාහන සේවාවන්ට එම මිල වැඩිවීම සෘජුව බලපායි. මෙවැනි තත්ත්ව හේතුවෙන් පහළ ආදායම් මට්ටමක පසුවන රටවල විදේශ විනිමය තෙල් මිලදී ගැනීම සඳහා වැඩි වැඩියෙන් යෙදවීම නිසා ආර්ථික අර්බුදයන් ද ඇතිවේ. අවසාන වශයෙන් ඛනිජ තෙල් පරිභෝජනය පහළ මට්ටමකට වැටීමත්, ජනජීවිතය අවුල් සහගත මට්ටමකට පැමිණීමත් වැළැක්විය නොහැකි ය. එමඟින් නිතැතින්ම මඟ විවර කෙරෙන්නේ බලශක්ති දරිද්‍රතාවයට ය.

බලශක්ති වියදම ඉහළයෑම ලොව සෑම රටකම පාහේ දක්නට ලැබෙන අර්බුදකාරී තත්ත්වයකි. බලශක්ති වියදම ඉහළ යෑමේ තත්ත්වය වෙසෙසින්ම කැපීපෙනෙන්නට පටන් ගත්තේ 2020 වසරේදී ය. යුරෝපා සංගමයට අයත් ජනගහනයෙන් මිලියන 35ක පිරිසකට හෙවත් එහි ජනගහනයෙන් 8%කට එම වසරේදී සිය නිවෙස් ප්‍රමාණවත් අන්දමෙන් උණුසුම්කර ගැනීමට නොහැකි වූයේ බලශක්ති මිල ඉහළ යෑම නිසයි. මේ තත්ත්වය තවදුරටත් අයහපත් අතට හරවන්නට රුසියාව - යුක්‍රේන යුධය බලපෑවේය. ගෘහ කටයුතු සඳහා අවශ්‍යවන බලශක්ති පිරිවැය 62.6%ත් 112.9%ත් අතර ප්‍රමාණයකින් වැඩි වූයේ යුද්ධය ආරම්භවන අවස්ථාවේදීම බව වාර්තා පෙන්වාදෙයි. රුසියාව - යුක්‍රේන ගැටුම හේතුවෙන් බලශක්තියේ පමණක් නොව ආහාරපානවල ද මිල වැඩිවූ බව නොරහසකි. එම ගැටුම්කාරී තත්ත්වයේ අවසානයක් මේ වනතුරුත් දැකිය නොහැකි ය. එබැවින්, ඉදිරි වසර දෙක ඇතුළතදී ද බලශක්ති මිල මෙන්ම ආහාර මිලද තවදුරටත් වැඩිවනු ඇතැයි විද්වත්හු පෙන්වාදෙති. රුසියාව - යුක්‍රේන යුධය හේතුවෙන් යුරෝපා ආර්ථිකයට සිදුවූ බලපෑම පිළිබඳ අධ්‍යයනයන් මේවනවිට සිදුකෙරේ ඇත. එම අධ්‍යයනයන්ට අනුව, බලශක්ති පිරිවැය ඉහළයෑම සාමාන්‍ය ජනයාගේ බලශක්ති සපුරා ගැනීමේ ක්‍රියාවලියට සෘජුවම බලපා තිබේ. ඒ හැරුණුවිට සේවා සහ භාණ්ඩවල මිල ඉහළ නැංවීමට, බලශක්ති මිල වැඩිවීම බලපා ඇත. සේවා සහ භාණ්ඩ පරිභෝජනය කරන ජනතාවට බලශක්ති මිල වැඩිවීම එහිදී වක්‍රාකාරයෙන් අත්විඳින්නට සිදුවේ. සාමාන්‍ය ජනතාවට දරාගත නොහැකි මට්ටමට බලශක්ති මිල මේ අන්දමට වැඩිවීම අන්තරාදායක ආදායම් මට්ටම්වල සිටි විශාල පිරිසක් ආන්තික දරිද්‍රතාවයට පත්කිරීමට හේතුවක් වී ඇතැයි ඇතැම් ලෝක සංවිධාන පෙන්වාදෙයි. 2020 වසරේ සිට එක්සත් රාජධානියේ බලශක්ති මිල වැඩිවූ අතර මේ වනවිට එය 40%කින් පමණ ඉහළ ගොස් ඇත. එකී තත්ත්වය හේතුවෙන් එරට ජනගහනයෙන් මිලියන 6.7කට ආසන්න සංඛ්‍යාවක් බලශක්ති දරිද්‍රතාවයෙන් පීඩා විඳින බව සඳහන්වේ. ජර්මනියේ බලශක්ති දරිද්‍රතාවයද ඉහළගොස් ඇති බව බලශක්ති විශේෂඥයෝ පෙන්වාදෙති. සෑම ජර්මන් ජාතිකයන් හතර දෙනෙකුගෙන් එක් අයෙකු බලශක්ති දරිද්‍රතාවයෙන් පෙළෙන බව දැක්වේ. බලශක්ති දරිද්‍රතාවයෙන් පීඩාවට පත්ව සිටින අඩු ආදායම්ලාභී ජනයාට සහන සැලසීමට ජර්මන් රජයට මේ නිසා සිදුව තිබේ.

නවීන බලශක්ති භාවිතයට අවශ්‍ය යටිතල පහසුකම් බොහෝ රටවල ග්‍රාමීය ප්‍රදේශවල අදටත් දක්නට නොලැබෙයි. එය කෙතරම් දැයි කිවහොත් එළදායී නවීන බලශක්තිය භාවිතයට ගැනීමට නොහැකි මිලියන 800කට ආසන්න පිරිසක් අප්‍රිකාවේ පමණක් ජීවත්වන බව අනාවරණය වී ඇත. ඇෆ්ඝනිස්තාන ජනගහනයෙන් 95% කට ආසන්න පිරිසක් භාවිතයට ගන්නේ සාම්ප්‍රදායික ජෛවස්කන්ධයන් ය. චැඩ් රාජ්‍යයේද ඇත්තේ එයට සමාන ම තත්ත්වයකි. ඝානා රාජ්‍යයේ ජනගහනයෙන් 87%ක් සාම්ප්‍රදායික ජෛවස්කන්ධ පරිහරණයට ගනිමින් සිය බලශක්ති අවශ්‍යතා සම්පූර්ණ කර ගනිති. සාම්ප්‍රදායික ජෛවස්කන්ධ භාවිතයෙන් ග්‍රාමීය ජනයා සිය බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීමේදී බහුල ලෙස පරිහරණයට ගන්නේ දර, ගල්අඟුරු, බෝග වගාවන්ගෙන් බැහැර කෙරෙන අපද්‍රව්‍ය (දහයියා, පිදුරු, උක්රොඩු), ලී කුඩු, ලී කැබලි ආදියයි. බලශක්ති උත්පාදක, සම්ප්‍රේෂණ රැහැන්, භූගත පයිප්ප පද්ධති ආදී යටිතල පහසුකම් නූතන බලශක්ති භාවිතය සඳහා අවශ්‍යවේ. එවැනි යටිතල පහසුකම් නොමැතිනම් ස්වභාවික වායුව, ඛනිජ තෙල්, විදුලිය භාවිත කිරීමට ඇති මං ඇහිරී යයි. එවැනි යටිතල පහසුකම් සඳහා විශාල වියදමක් දරන්නටද සිදුවේ. නූතන බලශක්තීන් භාවිතයට ගැනීමට බලශක්තියට සම්බන්ධ ඉහළ තාක්ෂණ ඥානයක්ද අවශ්‍යය. එසේ වුවත් ඉන්දියාව, චීනය, බ්‍රසීලය, රුසියාව වැනි රටවල ග්‍රාමීය ප්‍රදේශවල පවා නූතන බලශක්තීන් භාවිතයට ගැනෙනු දක්නට පුළුවන. එකී රටවලට ශක්තිමත් ආර්ථිකයන් තිබීම සහ බලශක්තියට සම්බන්ධ තාක්ෂණික ඥානයන් ඉහළ මට්ටමක තිබීම එයට හේතුවයි. එවැනි රටවල ග්‍රාමීය ප්‍රදේශවල වසන ජනයාට සාම්ප්‍රදායික ජෛවස්කන්ධ භාවිතයට ගනිමින් බලශක්ති අවශ්‍යතා සපුරා



ගැනීමෙන් යම් ප්‍රමාණයකට මිදෙන්නට හැකිව තිබෙන්නේ ඒ නිසයි. අන්තර්ජාතික බලශක්ති ඒජන්සිය සඳහන් කරන්නේ ලෝකයේ බොහෝ රටවල් සාම්ප්‍රදායික ජෛවස්කන්ධ ප්‍රයෝජනයට ගැනීමේ ක්‍රියාවලියෙන් ඈත්වීමේ ප්‍රවණතාවක් දැකිය හැකි බවයි. එසේ වුවත් දකුණු ආසියාතික රටවල් සහ සහරා කාන්තාරයට ආසන්නයේ පිහිටි අප්‍රිකා කලාපීය රාජ්‍යයන්වල ජනගහන වර්ධනයත් සමග සාම්ප්‍රදායික ජෛවස්කන්ධ භාවිතයට ගැනීම තවදුරටත් වැඩි වියහැකි බව එම ඒජන්සිය පෙන්වාදෙයි. කෙසේ වුවත් බලශක්තීන් උත්පාදනය කර ගැනීමේදී සහ දහනය කිරීමේදී පරිසරයට විමෝචනය කෙරෙන කාබන් - ඩයොක්සයිඩ් ආදී අපවායුන් පිළිබඳව සැලකිලිමත් වී සුනිත්‍ය බලශක්ති ප්‍රභව භාවිතයට ගනිමින් බලශක්තිය ජනනය කරගැනීම වෙත යොමුවිය යුතු බව විද්වතුන්ගේ මතයයි.

කිසියම් රටක පහළ ආදායම් මට්ටමේ පසුවන පිරිස වැඩි වනවිට එම පිරිස අතර බලශක්ති භාවිතය ද අඩු වී යයි. ඔවුන් බලශක්ති දරිද්‍රතාවයට පත්වීම ද වැළකිය නොහැකි තත්ත්වයකි. විදුලිබල පහසුකම් තිබුණ ද එම පහසුකම තම නිවෙසට ලබාගැනීමට ආර්ථික වශයෙන් හැකියාවක් නොමැති පිරිස් අප්‍රිකාවේ ඇතැම් ග්‍රාමීය පෙදෙස්වල ජීවත්වන බව විද්‍යාඥයෝ පෙන්වාදෙති. ආර්ථික විද්‍යාඥයන් සඳහන් කරන්නේ දරිද්‍රතාවයෙන් පෙළෙන ජනයාට බලශක්තිය සඳහා ඔවුන්ගේ ආදායමෙන් 10%ත් 30%ත් අතර ප්‍රමාණයක් වැයවන බවකි. එසේ වුවත් දරිද්‍රතාවයෙන් පීඩා නොවිඳින ජනයා බලශක්තිය වෙනුවෙන් සිය ආදායමෙන් වැය කරන්නේ 5%ත් 7%ත් අතර ප්‍රමාණයක් බව ද තහවුරු වී තිබේ.

**මංජුලා විජයරත්න**







# බලශක්ති දරිද්‍රතාව

# පිටුදැකීමට නම්...

බලශක්ති දරිද්‍රතාවය නැති කිරීමේ මං ගැන ආර්ථික විද්‍යාඥයෝද, බලශක්ති විශේෂඥයෝද අද වැඩිපුර කතාකරති. ඒ අනෙකක් නිසා නොව එය සෘජුවම දරිද්‍රතාව සමග බැඳී පවත්නා බැවිනි. බලශක්ති දරිද්‍රතාව පිටුදැකිය හැකි වන්නේ කෙසේද යන්න එහිලා පැනනැගෙන අනෙක් වැදගත් පැනයයි. එය එක් පැත්තකින් බලශක්ති සංරක්ෂණ කාර්යය සමඟද බද්ධවේ. බලශක්ති දරිද්‍රතාව පිටුදැකීමේදී, එය හුදෙක් පෞද්ගලික මට්ටමෙන් පමණක් බැලීම ද නොසෑහේ. මහා පරිමාණ ආයතනවල බලශක්ති භාවිතය වෙතද අවධානය යොමුවිය යුතුව ඇත. මන්ද, ඩීසල් බලාගාරවලින්, ගල්අඟුරු බලාගාරවලින් උත්පාදනය කෙරෙන විදුලිය වැඩිපුර භාවිතයට ගැනෙන්නේ එවැනි ආයතන තුළ නම්, ඒවායේ බලශක්ති භාවිතය ඉතා කාර්යක්ෂම වියයුතුව ඇත. එසේ නොවුණහොත් විදේශ විනිමය විශාල වශයෙන් වෙනත් රටවලට ඇදී යෑමේ අනර්ථය වැළක්විය නොහැකිය.

### 1. බලශක්ති දරිද්‍රතාව සහ කාර්යක්ෂම බලශක්ති භාවිතය සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීම

තමන් බලශක්ති දරිද්‍රතාවයෙන් පීඩාවට පත්ව සිටින බව ඊට ගොදුරුව සිටින බොහෝ දෙනෙක් නොදනිති. ඒ බැව් පෙන්වාදෙන තුරු සාමාන්‍ය ජනයාට ඒ සම්බන්ධයෙන් අවබෝධයක් ද නැත. මේ නිසා දැනුවත් කිරීමේ වැඩසටහන් උපයෝගී කරගෙන සමාජය පුරා ඊට අදාළ දැනුම ව්‍යාප්ත කිරීම ඉතා වැදගත් කාර්යයක් ලෙස දැක්විය හැකිය. එවැනි දැනුවත් කිරීම් සඳහා ගතවන කාලය සාපේක්ෂව අඩුය. වියදම ද සාපේක්ෂව අඩුය. එමඟින් ලැබෙන ප්‍රතිඵල වැඩිය. බලශක්ති දරිද්‍රතාවයෙන් පීඩාවට පත්ව සිටින අය සහ එයට ගොදුරුවන්නට ආසන්නයේ සිටින පිරිස් හඳුනා ගැනීමටද ඉන් ඉඩ සැලසෙයි.

සාමාන්‍ය ජනයාට වඩාත් තදින් දැනෙන්නේ ගෘහස්ථ බලශක්ති දරිද්‍රතාවයයි (Domestic energy poverty). එමඟින් අදහස් කෙරෙන්නේ යම්කිසිවකුට එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වුවමනා වන මූලික බලශක්තීන් හෝ බලශක්ති සේවා ලබා ගැනීම දැරිය නොහැකි මට්ටමක තිබීමයි. කෙනෙකු සපුරා ගතයුතු අවශ්‍යතා රටෙන් රටට, කලාපයෙන් කලාපයට වෙනස්වේ. එසේ වූවත් නිවෙසක් ආලෝකවත් කර ගැනීම, ආහාර පාන පිසගැනීම, ශීත රටක වාසය කරන කෙනෙකුට නම් තම නිවෙස උණුසුම්කර ගැනීම සහ උණුසුම් රටක ජීවත් වන කෙනෙකුට තම නිවෙස සිසිලනය කර ගැනීම යන අවශ්‍යතා ලොව කවර රටක, කවර කලාපයක විසූවද සෑම කෙනෙකුටම පොදුය. ඒ හැරුණුවිට අධ්‍යාපනයට සෞඛ්‍යට සහ සන්නිවේදන කටයුතුවලට ලොව සෑම පුද්ගලයකුටම බලශක්තිය අවශ්‍යවේ. වසරකට එක් පුද්ගලයකුට ආහාර පිසීමේ කාර්යය සඳහා ගෑස් කිලෝග්‍රෑම් 35ක් පමණ අවම වශයෙන් අවශ්‍යවන බවට ගණන්බලා තිබේ. ඒක පුද්ගල ආලෝකකරණ කාර්යය සඳහා වසරකට කිලෝවොට් පැය 120ක් පමණ අවම වශයෙන් අවශ්‍ය බවද බලශක්ති විශේෂඥයෝ පෙන්වා දෙති. මෙම තොරතුරුවලට සාපේක්ෂව බලශක්ති දරිද්‍රතාවයෙන්

පෙළෙන පුද්ගලයන් හඳුනා ගැනීම පහසුවෙන් කළ හැකිය.

## 2. ඛනිජ තෙල් භාවිතය අවම කිරීමට පියවර ගැනීම

ඛනිජ තෙල් සම්පත පිහිටා නොමැති, පහළ ආදායම් මට්ටමේ පසුවන රටවල රජයන්ට ඛනිජ තෙල් ආනයනය කිරීමට සිදුවීම විශාල ගැටලුවක්වී තිබේ. එයට හේතුව විදේශ විනිමය විශාල වශයෙන් එකී කාර්යය සඳහා වැයවීමය. ඛනිජ තෙල් ඉල්ලුම පහළ හෙළිය හැකි වන්නේ පෞද්ගලික වාහන පරිහරණය ප්‍රවර්ධනය කිරීමට වඩා පොදු ප්‍රවාහන සේවාවන් දියුණුකර ප්‍රවර්ධනය කිරීමෙනි. බලශක්ති දරිද්‍රතාව පිටුදැකීමේදී එය ඉතා වැදගත් සහ ඵලදායී කාර්යයකි. තම පෞද්ගලික වාහනයෙන් නගරවලට පැමිණ අනතුරුව පොදු ප්‍රවාහන සේවාවන් භාවිතයට යොමුවන පිරිස්වලට වාහන නවතා තැබීමේ පහසුකම් ද දියුණු කළයුතුව ඇත. ඒ හැරුණුවිට ඇවිදීමට වඩාත් යෝග්‍ය මං තීරු සැකසීමෙන් කෙටිදුර පයින් ගමන් කිරීම සඳහා ජනතාව පෙලඹවිය හැකිය. පාපැදි භාවිතය වැඩිකිරීමට පියවර ගැනීම ද ඛනිජ තෙල් පරිහරණය අඩු කිරීමට මඟකි.

## 3. බලශක්තිය අවම මට්ටමෙන් පරිහරණය කෙරෙන අන්දමට නිවාස සහ සෙසු ගොඩනැඟිලි ඉදි කිරීම සඳහා මාර්ගෝපදේශනය සැපයීම

නිවාස හෝ අනෙකුත් ගොඩනැඟිලි හෝ බලශක්තිය සංරක්ෂණය වන අන්දමට ඉදිකිරීම බලශක්ති දරිද්‍රතාවයෙන් මිදීමට මඟකි. පළපුරුදු ගෘහ නිර්මාණ ශිල්පියකු ගොඩනැඟිල්ලක හෝ නිවෙසක හෝ සැලසුම නිර්මාණය කරන්නේ එම ගොඩනැඟිල්ලට හෝ නිවෙසට හෝ අවශ්‍ය තරම් ආලෝකය සහ වාතාශ්‍රය ලැබෙන පරිදී ය. එසේ වුවත් නිවාස සහ ගොඩනැඟිලි තනන අප බොහෝ දෙනෙකු එහි සැලසුම විද්‍යානුකූලව සහ විධිමත්ව සකස් කර ගැනීමට නොපෙලඹීම කනගාටුවට කරුණකි. එයින් අමුද්‍රව්‍ය අපතේ යෑමක් සිදුවේ. අනෙක් අතට විද්‍යානුකූලව සහ විධිමත්ව සකස් කරගත් සැලසුමකින් තොරව ඉදිකරන ගොඩනැඟිලිවල වාසය කිරීම ද අපහසුය. එයට හේතුව, අවශ්‍ය තරම් වාතාශ්‍රය සහ ආලෝකය නොමැති වීමයි. එවැනි අවස්ථාවලදී විශාල වියදමක් දරමින් වායුසමන යන්ත්‍ර සහ විදුලි බුබුළු සවිකරන්නට සිදුවේ. විදුලිය වැඩිපුර භාවිත වන බැවින් ඒ සඳහා විශාල වියදමක් ද දරන්නට සිදුවේ. මේ ගැටලු සහගත තත්ත්වය මඟහරවා ගැනීමට සාමාන්‍ය ජනයාට මාර්ගෝපදේශනය ලබාදීම ඉතා වැදගත්වේ. ගෘහයන් සහ ගොඩනැඟිලි නිර්මාණය පිළිබඳ කරුණු ඇතුළත් උපදේශමාලාවන් සැකසීමෙන් මාර්ගෝප-දේශනය ලබාදෙන්නට පුළුවන.

## 4. බලශක්ති කළමනාකරණය සඳහා විශේෂයෙන් පුහුණුකරණ ලද කළමනාකාරවරයකු ආයතනවලට පත්කිරීම

ආයතනවල විවිධ විෂයයන් සඳහා ප්‍රධානීන්, කළමනාකාරවරුන් පත්කර තිබෙනු අපට කොතෙකුත් දක්නට ලැබෙයි. ආයතනයක මූල්‍ය කටයුතු පාලනය කිරීම සඳහා ගණකාධිකාරීවරයෙකු, මූල්‍ය කටයුතු භාර කළමනාකාරවරයෙකු පත් කෙරේ. එසේ වුවත් ආයතනයක බලශක්තිය කළමනාකරණය සඳහා එවැනි තනතුරක් ස්ථාපනයකර නොතිබීම අප රටේ දක්නට හැකි තත්ත්වයකි. යම් නිශ්චිත කාල සීමාවක් ඇතුළතදී ආයතනයේ බලශක්තිය භාවිතය වැඩිවුණි ද, අඩුවුණි ද එසේත් නැත්නම් ඒ මට්ටමෙන්ම තිබුණිද යන්න විශ්ලේෂණයකර බැලීම ඉතාමත් වැදගත්ය. කාර්යාලයක මූල්‍ය වංචාවක් සිදුවුවහොත් විගණන විමසුමක් කිරීම, ඊට වැරදිකරුවන අයවලුන්ට චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීම සාමාන්‍යයෙන් සිදුවන දෙයකි. එසේවුවත් ආයතනයේ බලශක්තිය වැඩිපුර භාවිත කිරීම වරදක් ලෙස දැකීමවත්, ඊට සම්බන්ධ අයවලුන්ගෙන් කරුණු විමසීම හෝ ඔවුන්ට චෝදනා පත්‍ර ඉදිරිපත් කිරීම හෝ අප රටේ තවමත් සිදු නොවේ. එහිදී සිදුවන්නේ ද ජාතික ධනය අයථා ලෙස පරිහරණය කිරීමකි. ආනයනය කරනු ලබන ඛනිජ තෙල් මඟින් හෝ ගල්අඟුරු මඟින් හෝ උත්පාදනය කෙරෙන විදුලිය, ආයතනයක් ඇතුළතදී අවිචාරවත් ලෙස භාවිතයට ගැනීම රටේ බලශක්ති වියදම වැඩිවීමට හේතුවක් වන අතර එම වියදම අවසානයේදී දරන්නේ මහජනතාවය. මහජනතාවගේ බලශක්ති බිල්පත වැඩිවීම ඔවුන්ව දරිද්‍රතාවයට පත් කිරීමකි.

## 5. බලශක්ති විගණන මඟින් ආයතනයක බලශක්ති භාවිතය විද්‍යානුකූලව නිවැරදිකර ගැනීම

ආයතනයක බලශක්තිය කාර්යක්ෂම අන්දමින් භාවිතයට ගැනේද යන්න පිළිබඳව නිවැරදි තක්සේරුවක් ඇතිකර ගැනීමට බලශක්ති විගණනයක් වැදගත් වේ. එම ආයතනයේ ඒ ඒ අංශවලින් සිදුකෙරෙන කාර්යය, දැනට භාවිත වන බලශක්ති ප්‍රමාණයට වඩා අඩුවෙන් භාවිතයට ගෙන සිදුකළ හැකිද යන්න එහිදී සොයා බැලේ. කෙටියෙන් කිවහොත් ආයතනයේ දැනට පරිහරණයවන බලශක්තිය සම්බන්ධ තොරතුරු මෙමඟින් අනාවරණය කෙරේ. ආයතනයේ බලශක්ති භාවිතය පිළිබඳව තවදුරටත් ගත යුතු තීන්දු තීරණ නිවැරදිකර ගැනීමට එවැනි විද්‍යාත්මක විගණනයක් ඉවහල් වේ.




### 6. කාර්යක්ෂම විදුලි උපකරණ භාවිතයට ගැනීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහන් කරන්නේ ගෘහස්ථ විදුලිය භාවිතයෙන් 15%ක් ම පරිභරණය කෙරෙන්නේ ආලෝකකරණ කටයුතු සඳහා බවයි. මෙයට කලකට ඉහත නිවෙස් ආලෝකවත් කිරීම සඳහා පරිභරණය කෙරුණේ සූත්‍රිකා විදුලි බුබුළුය. වොට් 75ක සූත්‍රිකා විදුලි බුබුළක් දිනකට පැය හතරක් බැගින් මාසයක් දැල්වීමට (75X4X30/1000 යන ගණනයට අනුව) කිලෝවොට් 9ක විදුලිය ප්‍රමාණයක් අවශ්‍ය වේ. වර්තමානය වනවිට අප භාවිතයට ගන්නේ එල්.ඊ.ඩී. විදුලි බුබුළු ය. වොට් 9ක එල්.ඊ.ඩී. බල්බයක් දිනකට පැය 4 බැගින් මාසයක් දැල්වීමට (9X4X30/1000 යන ගණනය කිරීමට අනුව) අවශ්‍යවන්නේ කිලෝවොට් 1.08ක විදුලිය ප්‍රමාණයකි. සූත්‍රිකා විදුලි බුබුළකට වැයවන විදුලිය ප්‍රමාණයෙන් අටෙන් එකක් පමණක් එල්.ඊ.ඩී. විදුලි බුබුළකට වැයවන බව මෙම ගණනය කිරීම්වලින් ඔබට තහවුරුවේ. විදුලිය ඒකකයක් කවර මිලක් වුවද සූත්‍රිකා විදුලි බුබුළක් භාවිත කිරීමේදී වැඩි වියදමක් දරන්නට සිදුවනබව මෙමඟින් පැහැදිලිවේ. සූත්‍රිකා විදුලි බුබුළක ආයු කාලයට වඩා 20 ගුණයක පමණ ආයු කාලයක් එල්.ඊ.ඩී. විදුලි බුබුළකට ඇතිබව සඳහන් වේ. කෙසේ වුවත් එල්.ඊ.ඩී. විදුලි බුබුළක් මිලදී ගැනීමට වැඩි මුදලක් වැය කරන්නට සිදුවනබව නම් සැබෑවකි. එල්.ඊ.ඩී. විදුලි බුබුළක් මිලදී ගන්නට ඒ අන්දමට වැඩි මුදලක් වැය කරන්නට සිදු වුවද එල්.ඊ.ඩී. විදුලි බල්බ ඔබගේ දෛනික විදුලි වියදම පහළ හෙළන්නට උපකාරී වන බව අප අවබෝධකර ගත යුතුව ඇත.

නිවෙසක් ආලෝකවත් කර ගැනීමේ කාර්යයේදී වඩාත් කාර්යක්ෂම බල්බය තෝරා ගැනීම මෙන්ම නිවසේ විවිධ ස්ථානවලට ගැළපෙන බල්බයද යොදාගෙන බලශක්තිය නිසි පරිදී කළමනාකරණය කර ගත යුතුව ඇත. කියවීම, ලිවීම, මැසීම වැනි කාර්යයක් සිදුකරන ස්ථානයකට ඉහළ ආලෝකයක් අවශ්‍යවේ. එසේ වුවත් රූපවාහිනිය නරඹ, ගුවන්විදුලියට සවන්දෙන ස්ථානයකට ඒ තරම් ඉහළ ආලෝකය ප්‍රමාණයක් අවශ්‍ය නොවේ. නිවසේ ඒ ඒ ස්ථානවලට අවශ්‍යවන ආලෝක ප්‍රමාණය විශේෂඥයන් ගණනයකර තිබේ. එකී ප්‍රමාණයන්ට සරිලන ලෙස නිවසේ එක් එක් කොටස් ආලෝකවත්කර ගන්නේනම් බලශක්තිය සඳහා අනවශ්‍ය ලෙස වියහියදම් කරන්නට සිදු නොවේ. ඉඳගැනීමට, විවේක ගැනීමට නිවසේ වෙන්කර ඇති සාලය කොටසකට අවශ්‍ය වන්නේ ඝන මීටරයට ලුමෙන් 50 ක පමණ ආලෝකයකි. එසේ වුවත් නිවෙස තුළ පොත් කියවීම් සිදුකරන ස්ථානයට එකී ආලෝක ප්‍රමාණය සෑහෙන්නේ නැත. එවැනි තැනකට ඝන මීටරයට ලුමෙන් 300ක් පමණ ආලෝක ප්‍රමාණයක් අවශ්‍ය වේ. මුළුතැන්ගෙයද වඩාත් හොඳින් ආලෝකවත්වී තිබියයුතු ස්ථානයකි. කියවීම්, ලිවීම් ආදී කටයුතු සිදුකරන ස්ථානයට යොදන තරමේ ආලෝක ප්‍රමාණයක් මුළුතැන්ගෙට අවශ්‍ය නොවේ. සාමාන්‍යයෙන් සඳහන් වන්නේ ඝන මීටරයට ලුමෙන් 200ක් පමණ

ආලෝක ප්‍රමාණයක් මුළුතැන්ගෙට තිබේ නම් සෑහෙන්නේ යැයි කියාය. නාන කාමරයකට අවශ්‍යවන්නේ ඝන මීටරයට ලුමෙන් 100ක තරම් ආලෝකයකි. එවැනි ම ආලෝක ප්‍රමාණයක් එනම් ඝන මීටරයට ලුමෙන් 100ක පමණ ආලෝකයක් අවශ්‍යවන තවත් ස්ථානයක් ලෙස නිවෙසට ඇතුළු වන තැන නම් කරන්නට පුළුවන. එසේ වුවත් ඔබගේ කාර්යාල කාමරයට අවශ්‍ය වන්නේ ඝන මීටරයට ලුමෙන් 200ක පමණ ආලෝක තත්ත්වයකි. නිවෙසින් පිටත පිහිටි ස්ථානයකට නැත්නම් නිවෙසේ ගරාජය වැනි ස්ථානයකට අවශ්‍ය වන්නේ වර්ග මීටරයට ලුමෙන් 50කට ආසන්න ආලෝකයකි. ඔබ, ඔබේ නිවෙස ආලෝකවත් කර ගැනීමේදී මෙවැනි කාරණා ගැනත් සිතිය යුතුව ඇත. අනවශ්‍ය ලෙස විදුලිය භාවිතයට ගෙන විශාල වියදමක් දරමින් බලශක්ති දරිද්‍රතාවයට පත්වීමෙන් වැළකී සිටින්නට ඔබට එවිට හැකිවනු ඇත.

## 7. ස්වභාවික ආලෝකයට සහ ස්වභාවික සිසිලනයට වැඩි ඉඩක් දෙමින් නිවෙස් ඉදි කිරීම

නිවැරදි දිශාවන්ට ජනේල යෙදුවහොත් නිවෙස ස්වභාවික ආලෝකයෙන් ආලෝකවත් කරගන්නට ඔබට ඉඩකඩ සැලසෙයි. ඔබ කළයුතු වන්නේ ස්වභාවික ආලෝකය නිවෙස තුළට ගලා එනපරිදී නිවෙස ඉදිකර ගැනීමට නිවැරදි සහ විද්‍යානුකූල ගෘහ සැලස්මක් ගෘහ නිර්මාණ ශිල්පියකු ලවා අන්දවා ගැනීමය. නිවසෙහි ජනෙල් උතුරු දිශාවට යෙදුවහොත් උදේ කාලයේදී නිවෙස අභ්‍යන්තරයට හිරු රැස් සෘජුවම ගලා එයි. එනිසා නිවෙස ඇතුළත ඇති වාතය රත්වී උණුසුම් ගතියක් ඇති වේ. බටහිර දිශාවට ජනේල දැමුවහොත් සවස් කාලයේදී මෙයට සමානම තත්ත්වයක් ඇතිවේ. නිවෙස තුළට වැඩි ආලෝකයක් ලැබෙන්නේ නැගෙනහිර සහ බටහිර දිශාවලින් බව අමතක නොකරන්න. දවසේ වැඩි කාලයක්, උපරිම ආලෝක ප්‍රමාණයක් රඳවා ගත හැකිවන අන්දමට කවුළු යෙදියහැකි ක්‍රමය තෝරා ගන්න. උතුරු සහ දකුණු දිශාවලට වැඩි ජනේල ප්‍රමාණයක් යෙදීම ඊට කදිම පිළිතුර වේ.

නිවෙසේ ඇති උෂ්ණ වාතය පිටතට ගලා යෑමටත් බැහැර ඇති සිසිල් වාතය නිවෙස තුළට ගලා ඒමටත් හැකි ආකාරයට නිවෙසට ජනේල මෝස්තර තෝරා ගන්න. එහිදී ලූවර් ජනේල මෝස්තරය වඩා වැදගත් වේ. ඉහළ ලූවර් එළියටත්, පහළ ලූවර් ඇතුළටත් විවෘත වන ආකාරයට සවිකිරීම වඩාත් ඵලදායීය. ඉහළ ලූවර් වසා තැබෙන විට ලූවර් දෙකක් අතර මිලිමීටර 5ක පමණ පරතරයක් විවෘතව සිටින ආකාරයට ලූවර් යෙදිය යුතුව ඇත. ඒ ක්‍රමයට ලූවර් සවිකිරීමෙන් නිවෙස තුළ සිසිලනය රඳවා ගැනීමට ඉවහල්වන කාරණා දෙකක් සපුරා ගත හැකිවේ. ඉන් පළමුවැන්න, ඇතුළත රත්වූ වාතය පිටතට යෑම අවහිර නොකිරීමය. දෙවැන්න, එළියේ ඇති සිසිල් වාතය කිසිදු බලයක් නොමැතිව නිවෙස ඇතුළතට පැමිණීමට ඉඩකඩ සැලසීමයි.

නිවෙස ආසන්නයේ ගස්කොළන් වවා ඒවා නිසි ආකාරයෙන් නඩත්තු කරන්න. නිවෙස අභ්‍යන්තරයට ගලා එන වාතය සිසිල් තත්ත්වයෙන් පවත්වා ගැනීමට එය මඟක් වනු ඇත. මුළු ගෙදරම සෙවණ වන ආකාරයට ගස්කොළන් වවා ඇත්නම් ගෙදර උෂ්ණත්වය සෙල්සියස් අංශක 2කින් පමණ අඩු කරගන්නට හැකිවේ. මේ ක්‍රම අනුගමනය කළවිට නිවෙස ආලෝකකරණය කිරීමේ කාර්යටත්, සිසිලනය කිරීමේ කාර්යටත් අවශ්‍ය වන්නේ අඩු විදුලිය ප්‍රමාණයකි. එය බලශක්ති දරිද්‍රතාවයෙන් මිදෙන්නට උපකාරීවන මඟකි.

## 8. විදුලිය වැඩිපුර භාවිත නොකෙරෙන අන්දමට ගෘහයේ අභ්‍යන්තරය නිමාකර ගැනීම

වොට් අඩු ප්‍රමාණයකින් නිවෙස ආලෝකවත්කර ගැනීමට නම් නිවසේ ඇතුළත බිත්තිවල ළා පැහැයක් ආලේපකර තිබීම වැදගත් වේ. එසේම දොරජනෙල් තිර





රෙදි සඳහා ළා පැහැති වර්ණයක් තෝරා ගන්න. සුදු පැහැති සිවිලිම, කෘත්‍රිම ආලෝකයත්, දිවා ආලෝකයත් නිවෙස තුළ රඳවා ගන්නට උපකාරීවේ. වාර්නිෂ් කළ ලී සිවිලිමෙන් වගේම පැනලින් නිසාත් නිවෙස ඇතුළත අඳුරු ස්වභාවයක් ගනියි. මේ උපදෙස්වලට අනුව නිවෙස පවත්වාගෙනයෑම ඔබේ පසුම්බියට වාසිදායකය.

## 9. අවශ්‍යම විද්‍යුත් උපාංග පමණක් මිලදී ගැනීම

බොහෝ නිවෙස්වල විවිධ මාදිලියේ විද්‍යුත් උපාංග තිබෙනු දක්නට ලැබෙයි. ඒවා කෙතරම් දුරට භාවිතයට ගන්නේ ද?, එවැනි උපකරණ භාවිතයට ගැනීම අවශ්‍යමද? යන්න ඔබ විචාරශීළිව විමසා බැලිය යුතුව ඇත. බොහෝ දෙනෙකුගේ නිවෙස්වල ශීතකරණ දක්නට ලැබෙයි. ශීතකරණයක් භාවිතයට ගැනීමේදී විදුලි බිල දෙගුණයක් වන අවස්ථා සුලභය. එතරම් වියදමක් දරමින් ඔබ ශීතකරණයක් භාවිතයට ගන්නේ කුමක් සඳහා ද? ඔබගේ දෛනික කටයුතු ශීතකරණයක් භාවිතයට නොගෙන කරගෙන යෑමට හැකියාවක් නැද්ද? වැනි කරුණු සම්බන්ධයෙන් වඩාත් තර්කානුකූලව විමසා බැලීම වැදගත්ය. ඔබ ග්‍රාමීය පෙදෙසක ජීවත්වන කෙනෙකු නම් නැවුම් එළවළු, පලතුරු ඔබට ලැබෙනවාට සැකයක් නැත. කොස්, කොස් ඇට, දෙල්, දෙහි, ආදී බොහෝ ආහාර වර්ග කල් තබාගැනීමේ ක්‍රම අපේ සංස්කෘතියේ ඇත. ඒ අනුව ශීතකරණයක් තුළට දමා ඔබට කල් තබාගන්නට වන්නේ කවර දේවල් ද යන්න ඔබ විමසා බැලුවහොත් ශීතකරණයක් ජීවිතයට අවශ්‍යම නොවන බවද පෙනීයන්නට පුළුවන. මෙරට නිවෙස්වල භාවිතයට ගැනෙන ශීතකරණ සම්බන්ධයෙන් බලශක්ති ක්ෂේත්‍රයේ විශේෂඥයින් අධ්‍යයනයක් සිදුකර තිබේ. එම අධ්‍යයනයෙන් පෙනීගොස් තිබෙන්නේ ශීතකරණ තුළ බොහෝවිට ඇත්තේ බීම බෝතලයක්, වතුර බෝතල්, පලාමිටියක් වැනි එතරම්ම වැදගත් නොවන දේ බවයි. අවශ්‍යම නොවන එවැනිදේ අසුරා තැබීමට ශීතකරණයක් ගෙන මාසික විදුලි බිල ඉහළ නංවා ගැනීමෙන් ඔබ බලශක්ති දරිද්‍රතාවකරා ගමන් ගන්නා බව සිතන්න.

## 10. කාර්යක්ෂම විදුලි උපාංග නිවෙසේ පරිහරණයට තෝරා ගැනීම

විද්‍යුත් උපාංග මිලදී ගැනීමේදී පවුලේ අවශ්‍යතාව අනුව එම උපාංග මිලදී ගත යුතුය. නිදසුනක් ලෙස ශීතකරණයක් අලුතෙන් මිලදී ගන්නා අවස්ථාවක් ගැන සිතන්න. ශීතකරණයේ ස්වභාවය අනුව මසකට වැය වන විදුලිය ඒකක ගණනද වෙනස්වන බැව් ඔබ සිහියේ තබාගත යුතුය.

| ශීතකරණයේ ස්වභාවය | වැයවන වොට් ගණන (W) | මාසික විදුලි ඒකක ගණන (kWh) |
|---|---|---|
| තනිදොර ශීතකරණය | 70 - 100 | 38 - 54 |
| දොරදෙකේ ශීතකරණය | 125 - 140 | 67 - 75 |
| දොරතුනේ ශීතකරණය | 140 - 180 | 75 - 97 |

අවශ්‍යතාවයට සරිලන වොට් ගණන සහිත ශීතකරණයක් මිලදී ගන්න. ස්වයංක්‍රීයව අයිස් දියවන ශීතකරණයක ක්‍රියාකාරීත්වයට වැඩි ශක්ති ප්‍රමාණයක් අවශ්‍යවේ. ඉන්වර්ටර් යෙදූ ශීතකරණයක ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වන්නේ සාමාන්‍ය ශීතකරණයක ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය විදුලිය ප්‍රමාණයට වඩා 45%ක් අඩුවෙනි.

විදුලිපංකා මිලදී ගැනීමේදී ඉහළ බලශක්ති කාර්යක්ෂමතාවයකින් යුත් විදුලි පංකාවක් තෝරා ගන්න. විදුලි පංකාව අසුරා ඇති පෙට්ටියේ ලේබලය පරීක්ෂා කිරීමෙන් ඒ බැව් තහවුරුකර ගත හැකිය. මාදිලි කිහිපයක විදුලි පංකා වෙළෙඳපොළේ ඇත. එකකට එකක් වෙනස් විදුලිය ප්‍රමාණයක් ඒ එක එකකින් භාවිතයට ගැනේ.

| පංකා වර්ගය | වොට් ගණන (W) | දිනකට පැය හතර බැගින් භාවිත කළ විට වැය වන මාසික විදුලි ඒකක ගණන (kWh) | රාත්‍රියේදී පැය 8ක් භාවිත කළ විට දිනකට (kWh) |
|---|---|---|---|
| සිවිලින් විදුලි පංකා | 75 - 80 | 9 - 9.6 | 0.4 - 0.64 |
| මේස විදුලි පංකා | 35 - 50 | 9 - 9.6 | 0.28 - 0.4 |
| සිටුවා තබන විදුලි පංකා | 35 - 50 | 9 - 9.6 | 0.28 - 0.4 |
| බිත්ති විදුලි පංකා | 35 - 50 | 9 - 9.6 | 0.28 - 0.4 |

සිවිලින් විදුලි පංකාවලට වැයවන විදුලිය ප්‍රමාණය, අනෙක් පංකාවලට වැයවන විදුලිය ප්‍රමාණය මෙන් දෙගුණයක් පමණ වේ. එනිසා සෑමවිට ම අඩු විදුලිය ප්‍රමාණයකින් ක්‍රියාත්මක වන විදුලි පංකා භාවිතයට ගැනීම වාසිදායක ය.

පාරිභෝගිකයා නැඹුරු වියයුතු වන්නේ බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ විදුලි උපකරණ මිලදී ගැනීම සඳහාය. වෙළෙඳපොළේ කොතෙකුත් විදුලි උපකරණ දැකිය හැකි වුවද ඉහළ බලශක්ති කාර්යක්ෂමතාවක් සහිත උපකරණත් ඒ අතර දක්නට ලැබේ. ඒවා ප්‍රමිතිගත විදුලි උපකරණ ය. ප්‍රමිතියක් සහිත එවැනි විදුලි උපකරණ හඳුනා ගත හැකි වන්නේ ලේබල් වලිනි. ඉහළ කාර්යක්ෂමතාවක් සහිත එවැනි විද්‍යුත් උපාංග භාවිතයට ගැනීමෙන් විදුලි බිල අඩු කර ගන්නට පුළුවන.

### 11. විද්‍යුත් උපාංග භාවිතයට ගැනීමේදී, විදුලිය සඳහා වැයවන වියදම අඩු කර ගැනීමට හැකිවන ලෙස අපේ චර්යාව වෙනස්කර ගැනීම

ශීතකරණයක් භාවිතයට ගැනීමේදී රත්වන උපකරණ ඒ අසල භාවිත කිරීමෙන් වැළකීම ඉතා වැදගත් වේ. එමෙන් ම හිරු එළිය සෘජුව නොවැටෙන ස්ථානයක ශීතකරණය ස්ථානගත කිරීමටත් වගබලා ගතයුතු ය. උණුසුම් ආහාර ශීතකරණයේ තබන්නට පෙර නිවෙන්නට හැරීම ද කළයුතුම දෙයකි. ආහාර අසුරනවිට ශීතකරණය තුළ ඒ සඳහා වෙන්වූ ස්ථාන භාවිතයට ගන්න. ශීතකරණයේ දොර විවෘත කරන වාර ගණන හැකි තරම්අඩුකරන්න. ප්‍රමාණවත් තරම් ආහාර ද්‍රව්‍ය නොමැතිනම් ශීතකරණය ක්‍රියා විරහිත කර තබන්න. ශීතකරණය හොඳින් නඩත්තු කිරීමටත් ඔබ වගබලාගත යුතුයි. එම නඩත්තු කාර්යයේදී ශීතකරණයේ බීඩිම, දොර වෙත ඔබේ විශේෂ අවධානය

යොමුවීම වැදගත්ය. මෙවැනි සියුම් දේ ගැන කල්පනාකාරී නොවුණ හොත් විදුලි බිල වැඩිවේ. එය, ඔබව බලශක්ති දරිද්‍රතාවයට පමුණුවන්නට හේතුවකි.

වායුසමන යන්ත්‍රයක් භාවිතය කරන්නේනම් කාමරයට හිරු රැස් පතිතවීම වැළැක්විය යුතුය. වායුසමනය කර ඇති කාමරයේ දොර ජනේල ඉතා හොඳින් වසා තබන්න. එසේ නොවුණහොත් සිසිල් වාතය බැහැරට කාන්දු විය හැකිය. වායුසමන යන්ත්‍රයෙන් පිටවන වායු ධාරාවට බාධා වන පරිදී බඩුබාහිරාදිය ස්ථානගත නොකරන්න. එසේම වායුසමනය කළ ප්‍රදේශය තුළ තාපය මුදාහැරෙන උපකරණ භාවිත නොකරන්නටද වග බලා ගන්න.

ඔබ නිතර නිතර භාවිතයට ගන්නා විදුලි ඉස්ත්‍රික්කය ද මනා සැලකිල්ලෙන් පරිහරණය කරන්නේ නම් විදුලිය බිල අඩුකර ගත හැකිය. පාසල් යන දරුවන් සහ රක්ෂාවට යන අය සිටින විට දිනපතා ම වාගේ රෙදි මදින්නට සිදුවේ. විනාඩි 20ත් 30ත් අතර කාලයක් රෙදි මැදීම සඳහා සාමාන්‍යයෙන් ගතවේ.

එමඟින් මසකට විදුලි ඒකක 8ත් 24ත් අතර සංඛ්‍යාවක් විදුලි බිලට එකතු කෙරේ. සාමාන්‍ය ඉස්ත්‍රික්කයක් අඩුවොට් ගණනකින් සමන්විතය. එසේ වුවත් රත්වීමටත්, රෙදි මැදීම සඳහාත් වැඩි කාලයක් ගතවේ. එනිසා අනෙක් ඉස්ත්‍රික්ක සමග සසඳනවිට සාමාන්‍ය ඉස්ත්‍රික්කයක ක්‍රියාකාරීත්වය සඳහා වැඩි විදුලිය ප්‍රමාණයක් අවශ්‍යවේ. ඇඳුම්වල වැඩිපුර පොඩි වී ඇති තැන් ජල වාෂ්ප විදිය හැකි ඉස්ත්‍රික්කයකින් එකවරම මදින්නට පුළුවන. ජල වාෂ්ප විදිය හැකි ඉස්ත්‍රික්කයක් භාවිතයට අවශ්‍ය වන්නේ, සාමාන්‍ය ඉස්ත්‍රික්කයක් සඳහා අවශ්‍යවන විදුලි ප්‍රමාණයෙන් 50%ක් පමණ බැව් අනාවරණය වී ඇත.

මදින රෙදි එල්ලා තබා ගැනීම සඳහා හැන්ගර් සූදානම්කර ගත යුත්තේ ඔබ රෙදි මැදීම ආරම්භ කිරීමට පළමුවයි. සුළු වශයෙන් මැද ගත යුතු ඇඳුම් වෙන් කරගන්න. රෙදිවල ඝනකම අනුව ඇඳුම් වර්ග කරගත හැකි ය. වැඩි ඝනකමක් ඇති ඇඳුම් පළමුව මදින්න. ඉස්ත්‍රික්කයේ උෂ්ණත්වය ක්‍රමානුකූලව පාලනය කරමින් ඝනකම් ඇඳුම්වල සිට ඝනකම අඩු ඇඳුම් දක්වා මැදීම කරන්න. අවසන් රෙදි කිහිපය මදිනවිට ඉස්ත්‍රික්කය විසන්ධි කරන්න. රෙදි මැදීම අතරතුර ඉස්ත්‍රික්කය පසෙකින් තබන විට එහි පතුළ සිරස්ව තබන්න. සාමාන්‍ය ඉස්ත්‍රික්කයක් භාවිතයට ගන්නාවිට සතියක රෙදි එකවර මැදීම වාසිදායකය. රෙදි මැදිමේදී මේස කවරයට යටින් තුනී ඇලුමිනියම් ෆොයිල් කැබැල්ලක් යොදන්න. එවිට රෙදිවල දෙපැත්තම එකවිට හොඳින් මැද ගැනීමට පුළුවන. ඉස්ත්‍රික්කයක්



භාවිතයට ගැනීමේදී එහි කාර්යක්ෂමතාවය පිළිබඳව ද සැලකිලිමත් විය යුතුය. අමු කෙසෙල්කොළයක් මැදීමෙන් ඉස්ත්‍රික්කයේ පතුළ පිරිසිදු කර ගන්නට පුළුවන. ජල වාෂ්ප විදින ඉස්ත්‍රික්කවලට ආසවනය කළ ජලය යොදන්න. ජල වාෂ්ප පිටවන සිදුරු ඇහිරීම වැළැක්වීමට නිෂ්පාදකයන් ලබාදී ඇති උපදෙස් පිළිපදින්න.

රෙදිසෝදන යන්ත්‍රය, රූපවාහිනිය, බත් පිසිනය ආදී සෑම විද්‍යුත් උපාංගයක්ම මේ අන්දමට ඉහළ කාර්යක්ෂමතාවයකින් භාවිතයට ගැනීමෙන් විදුලිය සඳහා වැයවන මුදල අඩුකර ගැනීමට හැකිවේ. එය බලශක්ති දරිද්‍රතාවය පිටුදැකීමට මඟකි.

### 12. බලශක්ති ස්වයංපෝෂිතතාව ඇතිකර ගැනීම

නිවසේ භාවිතයට අවශ්‍ය බලශක්තියෙන් සැලකිය යුතු ප්‍රමාණයක් නිවසේදී ම උත්පාදනය කර ගැනීමට අවශ්‍ය තාක්ෂණය දැන් ඇත. වහලය මත සවිකරන සූර්ය පැනල භාවිතයට ගෙන විදුලිය ජනනය කර ගැනීමට පුළුවන. අතිරික්ත ජනනය අලෙවිකිරීමට හැකි පහසුකම්ද තිබේ. මේ හැරුණුවිට ජීවවායු ඒකක පහසුවෙන් සකසා ගැනීමටත් හැකිය. එමඟින්ද නිවසේ බලශක්ති අවශ්‍යතා සපුරා ගැනීමට පුළුවන.

**ප්‍රභාෂිණී ඉද්දමල්ගොඩ**






# ඔබ රතු කට්ට ළඟට ම ඇවිත් ද?

ඔබ බලශක්ති දරිද්‍රතාවයේ අවදානමට මුහුණ දී සිටින කෙනෙක් ද?. සමහරවිට ඔබ ඒ ගැන මේ වනතෙක් නොසිතන්නට ඇත. එහෙත් මෙතැන් සිට ඔබට ඒ ගැනත් සිතන්නට සිදුවන බව අපි මතක්කර දෙන්නෙමු. බලශක්ති දරිද්‍රතා අවදානමට ලක්ව සිටින්නේ දැයි සොයා ගත හැකිවන්නේ කෙසේද යන්න මීළඟ ගැටලුවයි. ඉතා සරලව ම කිවහොත් ඔබගේ මාසික ආදායමෙන් 10%ක ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක් ඔබ ඔබට අවශ්‍ය බලශක්තිය සපයා ගැනීම සඳහා වියපැහැදම් කරන්නේනම් ඔබ අවදානම් මට්ටමට ළඟාවී ඇති බව කිව හැකි ය. ඔබ ලබන ආදායමෙන් සියයට දහයකට වඩා වැඩි ප්‍රමාණයක් බලශක්ති බිල්පත් සඳහා වැය කළවිට ඔබට අනෙකුත් අවශ්‍යතා සඳහා වියදම් කිරීමට ඉතිරිවන්නේ ආදායමෙන් සියයට අනුවකට වඩා අඩු ප්‍රමාණයකි. ආහාරපාන, ඖෂධ, ගෙවල් කුලී, දරුවන්ගේ අධ්‍යාපනය, දෙමව්පියන් රැක බලා ගැනීම ආදී බොහෝ කටයුතු සඳහා වියදම් කිරීමට සිදුවන්නේ ආදායමෙන් සියයට අනුවකටත් වඩා අඩු එම කොටසයි. මසක කාලයක් පුරා එය කළමනාකරණය කර ගැනීම පහසු ඉලක්කයක්ද?. සමහරවිට එය කළමනාකරණය කරගන්නට නොහැකිව ඔබ ණය තුරුස් වලට පවා මැදිවන්නට ඉඩ තිබේ.

බලශක්ති දරිද්‍රතා අවදානම ආසන්නයට පැමිණ ඇති බව ඔබට තහවුරු වුවහොත් ඔබ වහා ම ඊට පිළියමක් සෙවිය යුතුව ඇත. බලශක්ති දරිද්‍රතාවයෙන් මිදීමට අනුගමනය කළහැකි ක්‍රියාමාර්ග දෙකක් තිබේ. ඉන් පළමුවැන්න ඔබේ ආදායම වැඩි කර ගැනීමය. ආදායම එකවරම වැඩි කර ගැනීම පහසු කර්තව්‍යයක් නොවේ. දෙවැනි ක්‍රියාමාර්ගය කාර්යක්ෂම බලශක්ති පරිභෝජනයකට හුරුවීම ය. වඩාත් පහසු, කාර්යක්ෂම බලශක්ති පරිභෝජනයකට හුරුවීම බව ඔබට පෙනීයනු ඇත. කාර්යක්ෂම බලශක්ති පරිභෝජනයකට හුරුවීමෙන් බලශක්තිය සඳහා වැයවන විශාල වියදම අඩු කර ගැනීමට පුළුවන. ඒ සඳහා සැලසුමක් සකසා ගන්න. බලශක්ති වියදම් දර්ශකයක් සකසා ගැනීමට ඔබටම පුළුවන.

නිවසට අවශ්‍ය බලශක්තිය විවිධ ප්‍රභව වලින් ඔබ ලබා ගන්නවා විය හැකිය. එම බලශක්ති ප්‍රභව ඔබ පළමුවෙන්ම හඳුනාගත යුතුය. මෙරට බොහෝ නිවාසවලට අද විදුලිබල පහසුකම් ඇත. එ නිසා විදුලිය සඳහා වැය වන මුදල ඔබ ලැයිස්තුවේ අංක එක හිමිකර ගන්නවාට කිසිදු සැකයක් නැත. ඒ හැරුණුවිට තවත් බොහෝ ප්‍රභව වලින් ඔබ බලශක්තිය ලබා ගන්නවා ඇත. භූමිතෙල්, ඩීසල්, පෙට්‍රෝල්, දර, එල්.පී. ගෑස් ඒ අතර තිබිය හැකිය. එසේම ප්‍රවාහනය කටයුතු සඳහා ඔබ කරන වියදම ද මෙම ලැයිස්තුවට ඇතුළත් වියයුතු බව අමතක නොකරන්න. තීරු දෙකක් සහිත වගුවක් සකස් කර එහි වම් පස තීරුවේ බලශක්තිය ලබා ගන්නා මාර්ගයත්, දකුණු පස ඒ එක් එක් අයිතමය වෙනුවෙන් දරන වියදමත් ඔබට සටහන් කරන්නට පුළුවන. අවසානයේදී බලශක්තිය සඳහා දරන වියදම්වල එකතුව ලබා ගන්න. එම එකතුව, ඔබගේ

මාසික වියදමෙන් කොපමණ ප්‍රතිශතයක්ද යන්න ගණනය කර ගන්න.

මෙම වගුවේ අඩංගු දත්ත විශ්ලේෂණය කිරීම ආරම්භ කරන්නට ඔබට දැන් පුළුවන. විදුලිය සඳහා වැඩි මුදලක් වැයවන බව පෙනීයයි නම් ඒ ගැන විශේෂ අවධානයක් යොමුකළ යුතුය. එයට හේතුව විදුලි බිල අඩුකර ගැනීම ඔබ අත පවත්නා බැවිනි. අනවශ්‍ය විදුලි පහන් නිවා දැමීම, බලශක්ති කාර්යක්ෂම විදුලි පහන් භාවිතයට ගැනීම, අවශ්‍යම විද්‍යුත් උපාංග පමණක් භාවිතයට ගැනීම, කාර්යක්ෂම විද්‍යුත්උපාංග භාවිතයට ගැනීම, අවම විදුලිය පිරිවැයක් ඇතිවන පරිදි විද්‍යුත් උපාංග භාවිත කිරීමට අදාළව අපේ චර්යාව වෙනස්කර ගැනීම වැනි පියවර අනුගමනය කිරීමෙන් අපට විදුලිය බිල අඩු කරගන්නට පුළුවන.

නිවෙසට නව විද්‍යුත් උපාංග මිලදී ගැනීමේදීද සැලකිලිමත් වන්න. නිදසුනක් ලෙස ඔබ රෙදි සෝදන යන්ත්‍රයක් මිලයට ගැනීමට යනවා යැයි සිතන්න. රෙදි සෝදන යන්ත්‍රයක් අවශ්‍යමද යන්න තීරණය කළයුත්තේ ඔබය. රෙදි සේදුම් යන්ත්‍රයකට වොට් 1500ක පමණ විදුලිය ප්‍රමාණයක් වැයවේ. රෙදි සෝදන යන්ත්‍රයක් භාවිතයේදී ඇතිවන එම වියදම ඔබට දැරිය හැකි ද යන්න මූලිකව ම සිතා බැලිය යුතු ය. සමහරුන් මෙවැනි විද්‍යුත් උපාංග මිලදී ගන්නේ පහසු ගෙවීමේ ක්‍රමයට ලැබෙන නිසයි. සේල් දමා ඇතිවිට ඒවායෙන් අඩුවට මිලදී ගත හැකි යැයි කල්පනාකර විද්‍යුත් උපාංග මිලදී ගන්නා අය ද සිටිති. ඒ අන්දමට විද්‍යුත් උපාංග මිලදී ගැනීමට තීරණය කිරීම සුදුසු නැත. එමඟින් සිදුවන්නේ ණය බර වැඩිවීම පමණි. අවශ්‍යතාවයට ගැළපෙන භාණ්ඩයේ ප්‍රමාණය සහ එහි ආයුකාලය වෙනුවෙන් දැරිය යුතු පිරිවැය ඔබේ අවධානයට ලක්විය යුතුවම ඇත.

මේ අන්දමට රෙදි සෝදන යන්ත්‍රයක් නිවෙසට අවශ්‍යම යැයි තීරණය කළපසු කවර ආකාරයේ යන්ත්‍රයක් මිලදී ගත යුතුද යන්න ගැන විමසිලිමත් වන්න. දෙආකාරයක රෙදි සෝදන යන්ත්‍ර වෙළෙඳපොළේ ඇත. එක් වර්ගයක් ස්වයංක්‍රීය රෙදි සෝදන යන්ත්‍රය. (Automatic) අනෙක් ආකාරය අර්ධ ස්වයංක්‍රීය රෙදිෙ සෝදන යන්ත්‍රය. (Semi automatic) ස්වයංක්‍රීය රෙදි සෝදන යන්ත්‍රයක ක්‍රියාකාරීත්වයට සාපේක්ෂව ඉහළ විදුලිය ප්‍රමාණයක් අවශ්‍යවේ. ඒ හැරුණුවිට මෝස්තර දෙකක රෙදි සෝදන යන්ත්‍ර ද වෙළෙඳපොළේ දක්නට ලැබෙයි. ඉන් එක වර්ගයක යන්ත්‍රවල රෙදි ඇතුළු කළහැකි වන්නේ යන්ත්‍රයේ ඉහළිනි. (Top loading) අනෙක් වර්ගයේ යන්ත්‍රවලට රෙදි ඇතුළු කළ හැකි වන්නේ ඉදිරි පසිනි (Front loading). වඩාත් කාර්යක්ෂම, ඉදිරි පසින් රෙදි ඇතුළු කරන රෙදි සෝදන යන්ත්‍රය. රෙදි සෝදන යන්ත්‍රයක් භාවිතයට ගැනීමේදී විදුලිය විශාල ප්‍රමාණයක් වැයවන බැවින් ඉන් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීමට ඔබ ඔබගේ චර්යාවද පෙළගස්වා ගත යුතුව ඇත. යන්ත්‍රයේ සඳහන් රෙදි ප්‍රමාණයම යන්ත්‍රයට ඇතුළු කිරීමට වගබලා ගන්න. අඩු රෙදි ප්‍රමාණයක් යන්ත්‍රයට ඇතුළු කළහොත් එය අකාර්යක්ෂම භාවිතයකි. පමණට වඩා වැඩියෙන් රෙදි ඇතුළු කිරීමෙන් යන්ත්‍රයේ මෝටරයට හානි සිදුවිය හැකිය. රෙදි සෝදන යන්ත්‍රය සතියකට කීවරක් භාවිත කළයුතුද යන්න තීරණය කිරීමද වඩාත් යෝග්‍යය. රෙදි වේළීමේ කාර්යයට රෙදි සෝදන යන්ත්‍රය භාවිත කරන්නේනම් ඊට වොට් 500ක පමණ විදුලිය ප්‍රමාණයක් වැයවේ.

එනිසා හැකි තරම් දුරට අව්වේ ලා රෙදි වියළා ගැනීමට පෙලඹෙන්න. රෙදි වියළා ගැනීමේදී, රෙදි එල්ලනයන් (hangers) භාවිතයට ගන්න. වියළා ගත් රෙදි අල්මාරිවල අසුරා තැබීමේදීත් රෙදි එල්ලනයන් භාවිතයට ගැනීමට අමතක නොකරන්න. එමඟින් රෙදි මැද ගැනීම පහසු කෙරේ. ඔබ සිදු කරන එක් එක් ක්‍රියාව මීළඟ ක්‍රියාවත් සමග බැඳී, එය බලශක්තිය සඳහා දැරීමට සිදුවන වියදමට එකතු වන බව ඔබට මෙමඟින් පෙනීයනු ඇත. එනිසා සෑමවිටම කල්පනාකාරීව සහ තාර්කික බුද්ධියෙන් යුතුව කටයුතු කරන්න.

සෙසු බලශක්ති ප්‍රභව නිසා දරන්නට සිදුවන වියදම අඩුකර ගැනීම ද මේ අන්දමට ම ඔබට සිදුකළ හැකිය. නිදසුනක් ලෙස ප්‍රවාහන කටයුතු සඳහා වැයවන වියදම වැඩි නම් ඒ පිළිබඳව පසු විපරමක් කිරීමට ඔබට පුළුවන. පසුගිය මාසයේදී ප්‍රවාහන වියදම් වැඩි වූයේ කුමන හේතුවක් නිසා ද? ඔබ වාහනයක් පාවිච්චි කරන කෙනෙකු නම් එහි ඉන්ධන වියදම වැඩිවීමට හේතු සොයාබලා ඒවා අඩුකර ගැනීමට පියවර යෙදිය හැකිය. සමහරු කුලී ත්‍රීවිල් රථවලින් ගමන්යෑම අද විලාසිතාවක් බවටත් පත්කර ගෙන සිටිති. එවැනි වියදම් කපාහැරීම සඳහා පියවර ගන්න. හැකි තරම් දුරට පොදු ප්‍රවාහන සේවා භාවිතයට ගැනීමෙන් ගමනා ගමන කටයුතු සඳහා යන වියදම අඩු කරගන්නට පුළුවන.

ඒ අන්දමට බලශක්ති වියදම කපාහැර එම මාසය සඳහා බලශක්ති වියදම් දර්ශකයක් සකසා නැවත විශ්ලේෂණය කර බලන්න. බලශක්තිය සඳහා වැයවන වියදම සම්බන්ධයෙන් එලෙස අවදියෙන් සිටීමෙන් බලශක්ති දරිද්‍රතාව අවදානම සෑහෙන දුරට යහපත් අතට කළමනාකරණය කර ගත හැකි ය.

**මංජුලා විජයරත්න**



# බලශක්ති දරිද්‍රතාව පහසුවෙන් පිටුදැකිය හැකි වන්නේ ගෘහණියටයි !

මුළුතැන්ගෙය යනු බලශක්ති වර්ග කිහිපයක් භාවිතයට ගැනෙන ස්ථානයකි. මේ බලශක්ති වර්ග කිහිපය අරපිරිමැස්මෙන් භාවිතයට ගැනීමේ භාරධූර කාර්යය තිබෙන්නේ ගෘහණිය අතය. මුළුතැන් ගෙයි බලශක්ති සංරක්ෂණය සෑමවිටම නිවසේ ආර්ථිකයට තදින්ම බලපාන බව අමතක නොකරන්න. කෙටියෙන් කිවහොත් බලශක්ති දරිද්‍රතාවයට පත් නොවීම සිටීම සම්බන්ධයෙන් ගෘහණිය මත පැටවෙන්නේ අසීමිත වගකීමකි, බරපතළ කාර්ය භාරයකි.

ආහාර පිසීම සඳහා ලාභදායීම බලශක්ති විශේෂය දරය. දර, ශ්‍රී ලංකාවේ ජාතික සහ ග්‍රාමීය ආර්ථිකයේ ප්‍රබල බලශක්ති ප්‍රභවයක්ද වේ. මෙරට පරිභරණය වන බලශක්ති ප්‍රමාණයෙන් 57.5%ක් සපුරා ගන්නේ දර වලිනි. ශ්‍රී ලංකාවේ වෙසෙන ජනගහනයෙන් 80%කට වඩා වැඩි පිරිසක් දර පරිභරණය කරති. එසේ වුවත් නාගරික මුළුතැන්ගෙයක දර භාවිතයක් දක්නට ලැබෙන්නේ නැත. මිලෙන් අධික වුවත් නූතන මුළුතැන්ගෙවල්වල වැඩි වශයෙන් භාවිතයට ගැනෙන්නේ ගෑස් සහ විදුලිය බව අනාවරණය වී ඇත.

ආහාර පිසීම සහ ජලය රත්කිරීම වැනි කාර්යයන් සඳහා විදුලිය භාවිතයට ගැනීම අධික වියදම් සහිතය. එවැනි කාර්යය සඳහා කාර්යක්ෂම දර ලිප් භාවිතයට ගැනීම වඩාත් සුදුසු බව බලශක්ති විශේෂඥයෝ පෙන්වාදෙති. ඉවුම් පිහුම් කටයුතු සඳහා පරිභරණයට ගත හැකි දර ලිප් වර්ග කිහිපයක් තිබේ. එම වර්ග සහ ඒවායේ කාර්යක්ෂමතාව මෙම වගුවෙන් දැක්වේ.

| උදුන් වර්ගය | කාර්යක්ෂමතාවය |
|---|---|
| ගල් තුනේ ළිප | 5% - 10% |
| අනගි උදුන් | 5% - 10% |
| ජීව ඉන්ධන බත් පිසිනය | 35% - 40% |

දර වලින් ආහාර පිසීමේදී ගල් තුනේ ළිපට වඩා නව උදුන් වර්ග භාවිතයට ගැනීම ගෘහණියගේ සෞඛ්‍යයටත්, මුළුතැන්ගෙයි අලංකාරයට සහ පිරිසිදුකමටත් යෝග්‍ය වේ.

විදුලි බලයෙන් ක්‍රියාත්මක වන බත් පිසිනය භාවිතයට ගනිමින් දිනකට දෙවරක්, හාල් කිලෝව බැගින් පිස ගත හොත් මසකට විදුලි ඒකක 15ක් පමණ වැයවේ. ඒ වෙනුවට ජීව ඉන්ධන බත් පිසිනය (Bio mass rice cooker) භාවිතයට ගතහොත් එම විදුලිය ඒකක 15 ඉතිරිකර ගන්නට හැකිවනු ඇත. හාල් කිලෝවක් පිස ගැනීම සඳහා විදුලි බලයෙන් ක්‍රියාකරන බත් පිසිනයකට මිනිත්තු 20ක් පමණ ගතවේ. එම හාල් ප්‍රමාණය ම ජීව ඉන්ධන බත් පිසිනයක් පාවිච්චියට ගෙන පිස ගන්නේ නම් ඒ සඳහා මිනිත්තු 45ක කාලයක් ගතවන බව හෙළි වී ඇත. ජීව ඉන්ධන බත් පිසිනයේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය පොල්කටු දෙකක් පමණි.

ඒ අනුව ජීව ඉන්ධන බත් පිසිනය වඩාත් වාසිදායක බව ඔබට පෙනී යනු නිසැකය. පොල්කටු පිලිස්සීමක් සිදුවන නිසා ජීව ඉන්ධන බත්පිසිනය භාවිතයේදී දැලි බැඳීමක් සහ දුම් බැහැරවීමක් සිදුවනු ඇතැයි ඔබට සැකයක් මතුවිය හැකිය. ජීව ඉන්ධන බත් පිසිනය නිර්මාණය කර හඳුන්වාදුන් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු සහ සංවර්ධන මධ්‍යස්ථානය හෙවත් නර්ඩ් ආයතනය සඳහන් කරන්නේ ජීව ඉන්ධන බත් පිසිනය භාවිතයේදී දැලි බැඳීම සහ දුම් බැහැරවීම අවම මට්ටමක පවතින බවයි. බලශක්ති දරිද්‍රතාවය පිටුදකින්නට වෙරදරන ගෘහණියකට එවැනි බත් පිසිනයක් කදිමට ගැළපෙයි.





දර උදුනට සාපේක්ෂව එල්.පී. ගෑස් උදුන කාර්යක්ෂමය. මෙරට වාර්ෂික ගෑස් භාවිතය සෑම වසරක් පාසාම ඉහළ යන බවද වාර්තා පෙන්වාදෙයි. ඒ අනුව ගෑස් විශාල වශයෙන් ආනයනය කිරීමට රජයට සිදු වී ඇත. එමඟින් සිදුවන්නේ රටේ විදේශ විනිමය බැහැරට ඇදී යාමකි. එය රටේ ආර්ථිකයට විශාල වශයෙන් බලපාන තත්ත්වයකි. සත්‍ය තත්ත්වය එසේ වුවත් නාගරික නිවෙස්වල ජීවත්වන කාර්ය බහුල ගෘහණියන් බොහෝවිට ඉවුම්පිහුම් කරන්නේ ගෑස් ළිපෙන්මය. සමහර ගෘහණියන්ට ඒ හැර වෙනත් විකල්පයක් ද නැත. එ නිසා ගෑස් ළිප කාර්යක්ෂමව භාවිතයට ගැනීම අරපිරිමැසුම්දායකය. හැමවිටම නිල්දැල්ල මතු කරගෙන ගෑස් ළිපෙන් ඉවුම් පිහුම් කිරීම වැදගත්ය. උදුනේ යට ඇති වා කවුළුව සීරු මාරුකිරීමෙන් නිල් දැල්ල මතු කරගත හැකිය. කහදැල්ල මතු වීම අකාර්යක්ෂම තත්ත්වයකි. ගෑස් ළිප මත පීඩන උදුන (Pressure cooker) භාවිතයට ගන්නේනම් එය තවදුරටත් කාර්යක්ෂමය. ගෑස් උදුනේ ප්‍රමාණයට සරිලන භාජන භාවිතයට ගැනීමට අමතක නොකරන්න. උදුනේ වා සිදුරු පිරිසිදු කිරීමටත් වග බලා ගන්න. ආහාර පිසීමට පාවිච්චි කරන්නේ මැටි භාජන නම් ගෑස් ළිප් සඳහාම සකසන ලද මැටිවලන් භාවිතයට ගන්න. ඒවා පැතලිය. ඝනකමෙන් අඩුය. එ නිසා එවැනි භාජන රත්වීමට ගත වන්නේ අඩු කාලයකි. එය ගෑස් ඉතිරිකර ගැනීමට හේතු වේ.

ඉවුම් පිහුම් කරන ක්‍රම වෙනස් කිරීමෙන් ගෑස් ළිප වඩාත් කාර්යක්ෂමව පරිහරණය කළ හැකිය. අල වර්ග තම්බා ගැනීමට අවශ්‍ය වනවිට කුඩා කැබලිවලට කපා ඒවා තම්බා ගන්න. එමඟින් අල තම්බා ගැනීමට ගත වන කාලය අඩු කරගන්නට පුළුවන. වෙළෙඳපොළෙන් මිලදී ගැනීමේදී ම කුඩා ප්‍රමාණයේ අල මිලදී ගැනීම ද වඩාත් ප්‍රායෝගිකය. ධාන්‍ය වර්ග තැම්බීමට පළමුව පෙඟෙන්න හරින්න. ධාන්‍ය පොඟවා ගන්නා ජලයට ආප්ප සෝඩා හෝ බේකින් පවුඩර් හෝ ස්වල්පයක් එකතු කරන්නේනම් ධාන්‍ය තැම්බීමට යන කාලය අඩු කරගන්නට පුළුවන. බත් සහ වෙනත් ආහාර වර්ග පිසීමේදී පියනකින් වසා පිස ගන්න. එවිට ජලය වාෂ්ප වී යෑම වළකියි. එ නිසා භාජනය තුළ වාෂ්ප වැඩි වී ආහාර පිසීමේ ක්‍රියාවලිය ඉක්මන් වේ. වතුර උණුකර ගැනීමේදී අවශ්‍ය කාර්ය සඳහා පමණක් වතුර උණුකර ගන්න. නිතර උණුවතුර අවශ්‍යවේ නම් වරක් රත්කර ගත් වතුර උණුවතුර බෝතලයක දමා තබාගෙන පාවිච්චියට ගන්න.

මුළුතැන්ගේ තුළ තවත් විවිධ විද්‍යුත් උපාංග භාවිතයට ගැනෙයි. ඇඹරුම් යන්ත්‍රය හෙවත් බ්ලෙන්ඩරය, විදුලි පෝරණුව (Oven), ගිල්වුම් තාපකය (හීටරය), ටෝස්ටරය, ශීතකරණය ඒ අතර ප්‍රධාන තැනක් ගනියි. මේ සෑම උපකරණයක්ම කාර්යක්ෂමව මෙන්ම නිවැරදි ආකාරයට භාවිතයට ගැනීම බලශක්ති බිල්පත අඩුකර ගැනීමට මඟකි.

**ප්‍රභාෂිණී ඉද්දමල්ගොඩ**


## ඔබගේ නිර්මාණ අප වෙත එවන්න



සංස්කාරක
"සංරක්ෂා"
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
අංක 72, ආනන්ද කුමාරස්වාමි මාවත,
කොළඹ 07.





# අක්වෙරළ (offshore Wind) සුළං විභවය අධ්‍යනය වාර්තාව එළිදැකී.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක කළ මෙරට අක්වෙරළ සුළං බල ශක්තිය මැන බැලීමේ අධ්‍යයනය වාර්තාව බලශක්ති ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් වෙත ඉදිරිපත් කිරීම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් එම්. පී. ඩී. යු. කේ. මාපා පතිරණ මහතාගේ ප්‍රධානත්වයෙන් 2023 පෙබරවාරි 07 වැනි දින වෝටර්ස් එජ් හිදී සිදු කෙරිණි.

ලෝක බැංකු උපදේශක Jary Vayiyen හා Marl Leybovrne විසින් ඉදිරිපත් කළ මෙම වාර්තාව අනුව මෙරට නොගැඹුරු මුහුදු තීරය තුළ මෙගා වොට් 17000ක හා සුළං විභවයක් ඇති බව තහවුරු කර ඇත.

දේශීය බලශක්ති අවශ්‍යතාවයෙන් 2030 වන විට 70%ක් පුනර්ජනනීය බලශක්ති මගින් සරිකර ගැනීමේ රජයේ ප්‍රතිපත්තිය සාක්ෂාත් කරගැනීම උදෙසා මෙම වාර්තාව මගින් පෙන්වා දී ඇති අක්වෙරළ සුළං විභවය ප්‍රයෝජනයට ගනිමින් මෙගා වොට් 1000ක් ජාතික විදුලිබල පද්ධතියට එක් කර ගැනිමේ හැකියාව මෙහිදී සාකච්ජා කෙරිණි.

**නිමල්කා සමරකෝන්**

## බලශක්ති කාර්යක්ෂම ශීතකරණ වැඩසටහන ආරම්භ කිරීම සහ ශීතකරණ සඳහා අවම බලශක්ති කාර්ය සාධන ලේබලය දියත් කිරීම



ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ශීතකරණ සැපයුම්කරුවන් ස්වේච්ඡා බලශක්ති ලේබල් කිරීමේ වැඩසටහනට සම්බන්ධ වීමට දිරිමත් කිරීම සහ ශීතකරණ සඳහා අලුතින් හඳුන්වාදුන් අවම බලශක්ති කාර්ය සාධන (MEP) ලේබලය පිළිබඳ ජනතාව දැනුවත් කිරීම සඳහා නියමු ශීතකරණ ප්‍රතිස්ථාපන ව්‍යාපෘතියක් 2023 පෙබරවාරි 17 වන දින BMICH හිදී දියත් කරන ලදී.

ප්‍රධාන ශීතකරණ අලෙවිකරුවෝ තිදෙනෙකු විසින් පිරිනමනු ලබන ශීතකරණ මාදිලි 15 ක් සඳහා MEP ලේබලය හඳුන්වාදෙන ලද අතර, පාරිභෝගිකයින්ට ඔවුන්ගේ මීළඟ මිලදී ගැනීමේදී කාර්යක්ෂම ශීතකරණ මාදිලියක් තෝරා ගැනීමට අවස්ථාව මෙයින් සැලසේ. මෙම අවස්ථාවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, ලංකා විදුලි පුද්ගලික සමාගමේ සභාපති, ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් සහභාගී විය.

මෙම නියමු ව්‍යාපෘතිය මගින් බස්නාහිර පළාතේ පාරිභෝගිකයන්ගේ පැරණි අකාර්යක්ෂම ගෘහස්ථ ශීතකරණ 1,000 ක් වෙනුවට නව MEP ලේබලය සහිත සහ බලශක්ති කාර්යක්ෂම ශීතකරණ ස්ථාපනය කිරීම ඉලක්ක කර ඇති අතර, වසරකට 480,000 kWhක විදුලි ඉතිරියක් ඇස්තමේන්තු කර ඇත. මෙය සාමාන්‍ය නිවසක විදුලි බිල ආසන්න වශයෙන් 30% කින් අඩු කිරීමකි.

මෙමගින් විදුලි ඉතිරිය ප්‍රායෝගිකව මැනීමට, ලේඛනගත කිරීමට සහ ඉවතලන ශීතකරණ සහ ඒ ආශ්‍රිත අන්තරායකර ද්‍රව්‍ය සඳහා විස්තීර්ණ බැහැර කිරීමේ ජාලයක් ඇති කිරීමේ හැකියාව පරීක්ෂා කිරීමට භාවිතා කරනු ඇත. මුළු රටම ආවරණය වන පරිදි විස්තාරණය කිරීම තුළින් වසර පහක් ඇතුළත පැරණි අකාර්යක්ෂම ශීතකරණ 500,000 ක් ඉවත් කිරීමට බලාපොරොත්තු වන අතර මෙයින් 500 GWhක විදුලි ඉතිරියක් (ජාතික විදුලි පරිභෝජනයෙන් දළ වශයෙන් 3% ක්) ඇස්තමේන්තු කර ඇත.

**නිමල්කා සමරකෝන්**

## සණස සමග ගමට

# බලශක්ති කාර්යක්ෂමතා වැඩසටහන

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය




ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සණස සමිති සමග එක්ව දිස්ත්‍රික් මට්ටමින් "සණස සමග ගමට" තේමාව යටතේ නිවසේ බලශක්ති කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් දියත් කර ඇත.

එහි නියමු වැඩසටහන 2023 පෙබරවාරි 12 වනදා බෙම්මුල්ල කඳඹළුවාව සණස සමිති ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. සණස නිලධාරීන් හා සාමාජික සාමාජිකාවන් 100 කට අධික පිරිසක් සහභාගි වූ මෙම වැඩසටහනට සම්පත් දායකත්වය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ඉංජිනේරු, අධ්‍යක්ෂ සනත් කිත්සිරි මහතා විසින් ලබා දෙන ලදි.

දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන මෙම බලශක්ති සංරක්ෂණය පිළිබඳ වැඩසටහනේ කොළඹ දිස්ත්‍රික් වැඩසටහන මාර්තු 05 වැනි දින උඩහමුල්ල සණස ශාලාවේදී පැවැත්වූ අතර සණස සාමාජිකයින් 160ක් පමණ සහභාගි වූ අතර එම වැඩසටහනේ සම්පත් දායකත්වය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ පී. පී. කේ. විජේතුංග මහතා විසින් ලබා දෙන ලදී.



දිස්ත්‍රික් මට්ටමින් පැවැත්වෙන මෙම බලශක්ති සංරක්ෂණය පිළිබඳ වැඩසටහන් මාලාවේදී සෑම සණස සමිතියකටම රු 50,000 ක් පමණ වටිනා බලශක්ති ලේබලය සහිත LED විදුලි පහන් 50 ක් පිරිනැමේ. එය දේශනය ඇසුරින් තම විදුලි බිල පෙර මාසයට වඩා පසු මාසයේ අඩු කරගන්නා සණස සාමාජිකයින් සඳහා පිරිනැමීම සඳහාය.

**නිමල්කා සමරකෝන්**

# බලශක්ති කළමණාකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන - මධ්‍යම පළාත් සභාව

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් පළාත් සභා මට්ටමින් බලශක්ති කළමනාකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුවක් ආරම්භ කෙරිණි. එහි නියමු ව්‍යාපෘතිය මධ්‍යම පළාත් සභා ලේකම් තුමියගේ ප්‍රධානත්වයෙන් 2023 මාර්තු 31 දින පළාත් සභා ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

මධ්‍යම පළාත් සභාව යටතේ සේවය කරනු ලබන සංවර්ධන නිලධාරීන් බලශක්ති කළමණාකරුවන් ලෙස පුහුණු කළ අතර ඔවුන් හරහා පළාත් සභාව යටතේ ක්‍රියාත්මක රාජ්‍ය ආයතනයන්හි මෙන්ම බල ප්‍රදේශයේ පෞද්ගලික ආයතනයන්හි බලශක්ති භාවිතය කාර්යක්ෂමව කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.



මෙමගින් අපේක්ෂා කෙරේ. මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ සනත් කිත්සිරි හා ප්‍රසන්න මල්දෙනිය මහතා හා නියෝජ්‍ය අධ්‍යක්ෂ විජිත ඒකනායක මහතා විසින් ලබා දෙන ලදී.

**අනුරුද්ධ එදිරිවීර**